අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி, உயர்கல்வி தொழிற் கல்வி அமைச்சு

Ministry of Education, Higher Education and Vocational Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயல்திறன் அறிக்கை

# Annual Performance Report

# 2025




## වෙළුම II - උසස් අධ්‍යාපනය

## இதழ் II - உயர் கல்வி

## Volume II - Higher Education

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2025

## උසස් අධ්‍යාපන

# පටුන

1 පරිච්ඡේදය – ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ..... 1
1.1 උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම ..... 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ..... 1
1.3 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය ..... 1
1.4 සංවිධාන සටහන ..... 2
1.4.1 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2025.12.31 දිනට ..... 3
1.5 ආංශික කාර්ය සාධනය ..... 4
1.5.1 පාලන අංශය ..... 4
1.5.2. මූල්‍ය කළමනාකරණ අංශය ..... 6
1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය ..... 7
1.5.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ..... 8
1.5.5. සංවර්ධන අංශය ..... 9
1.5.6. සැලසුම් අංශය ..... 10
1.5.7. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ..... 12
1.6. උසස් අධ්‍යාපන මූල්‍ය ප්‍රගතිය - 2025 ..... 13
1.7 විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ..... 13
1.7.1 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - නැගෙනහිර විශ්වවිද්‍යාලය ..... 13
1.7.2 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ..... 14
1.8. අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ..... 15
1.8.1 රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය ..... 15
1.8.2 රුහුණ විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය ..... 16
1.8.3 රුහුණ විශ්විද්‍යාලයේ නාවුක අධ්‍යයන මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ..... 16
1.8.4 රුහුණ විශ්විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ..... 16
1.8.5 සබරගමුව විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අදියර ..... 17
02. පරිච්ඡේදය - ප්‍රගතිය ..... 18
2. 1. ආංශික ප්‍රගතිය ..... 18
2.1.1. පාලන අංශය ..... 18
2.1.2. ගිණුම් අංශය ..... 23
2.1.3. ප්‍රසම්පාදන අංශය ..... 26
2.1.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ..... 27
2.1.5. සංවර්ධන අංශය ..... 28

2.1.6. විදේශ අධ්‍යාපන අංශය ........ 31

2.1.7. සැලසුම් අංශය ........ 40

2.1.8. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ........ 41

2.1.9. පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ........ 47

03. පරිච්ඡේදය - 2025.12.31 න් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........ 52

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ........ 52

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 53

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 55

3.4. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 59

3.5. 2025.12.31 දිනට මූලධන වියදම් සාරාංශය ........ 59

04. පරිච්ඡේදය - කාර්ය සාදන දර්ශක ........ 61

4.1 ආයතනයේ  කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ........ 61

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........ 62

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න. ........ 62

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග සැකෙවින් විස්තර කරන්න. ........ 64

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ........ 65

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 65

6.3 මානව සම්පත් සංවර්ධනය ........ 65

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව ........ 71

# 1 පරිච්ඡේදය – ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම

සියලු ම විශ්වවිද්‍යාල සිසුන් තාක්ෂණය සමඟ නව ලොව නව දැනුම සමඟ සම්බන්ධ කරවන්නටත්, 21 වැනි සියවසේ ඉදිරි දශකය තුළ ආර්ථිකය විසින් ඉල්ලා සිටින මානව ප්‍රාග්ධනය ඒ හරහා ගොඩනගන්නටත් රටක උසස් අධ්‍යාපන පද්ධතිය මහඟු කාර්යභාරයක් ඉටු කරයි. රටක් නොව ලොවක් අභියෝග සමඟ ඉදිරියට රැගෙන යාමේ දී ප්‍රාථමික, ද්විතීයික, හා තෘතියික උසස් අධ්‍යාපන පද්ධතීන් සංවර්ධනය වෙනුවෙන් අනාගත සැලසුම් ගොඩනගන්නට සියලු පාර්ශවයන්හි සාමූහික සහාය අතිශයින් ම වැදගත් වෙයි. මේ යටතේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකවීම දක්වා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය භාරය විහිදී යයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

**මෙහෙවර**

ප්‍රතිඵල අරමුණු කොටගත් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම.

**අරමුණු**

- උසස් අධ්‍යාපනය වෙත ප්‍රමාණවත් ප්‍රවේශ අවස්ථා සැලසීම.
- ඉහළ ලෝක මානනීය දර්ශකයන් හිමි පරිණාමිත සහ නව විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම.
- උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය සහ ගුණාත්මය වැඩි දියුණු කිරීම.
- පර්යේෂණ, ප්‍රකාශන සහ වාණිජ්‍යකරණය වැඩි දියුණු කිරීම.
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

## 1.3 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන ව්‍යුහය පිළිබඳව සලකා බැලීමේ දී, අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාල 17ක් සහ (සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල 16ක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලය මීට අයත් වේ) උසස් අධ්‍යාපන ආයතන 19ක් පවතී. එසේම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) ක්‍රියාත්මක වේ.

මීට අමතරව, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25ඒ වගන්තිය යටතේ නිශ්චිත උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සහ උපාධි ප්‍රදානය කිරීම සඳහා පිලිගත් ආයතන 31ක් පවතී.

## 1.4 සංවිධාන සටහන



## 1.4.1 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2025.12.31 දිනට

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | 1 | 1 | - |
| | | අතිරේක ලේකම් (සංවර්ධන හා ශිෂ්‍යත්ව) ශ්‍රී. ලං.ප.සේ. | 1 | 1 | - |
| | | අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) ශ්‍රී. ලං.ප.සේ. | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) | 1 | 0 | 1 |
| | | ප්‍රධාන මුල්‍ය නිලධාරී | 1 | 1 | - |
| | | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| | | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| | | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (විදේශ අධ්‍යාපන) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය) | 1 | 0 | 1 |
| | | අධ්‍යක්ෂ (සැලසුම්)* | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)** | 1 | 1 | - |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව / කුසලතා සංවර්ධන ) | 2 | 2 | - |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | - |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) - ශ්‍රී. ලං.ප.සේ. | 1 | 1 | - |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) ශ්‍රී ලං. ක්‍ර.සේ. | 2 | 1 | 1 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) - ශ්‍රී ලං. ක්‍ර.සේ. | 1 | 1 | - |
| | | සහකාර ලේකම් ( ශ්‍රී. ලං.ප.සේ.) | 2 | 1 | 1 |
| | | ගණකාධිකාරී | 1 | 1 | - |
| | | නීති නිලධාරි | 1 | 1 | - |

*1.1 වගුව*

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (ii) | තෘතියික | පරිපාලන නිලධාරි | 1 | 0 | 1 |
| | | භාෂා පරිවර්තක | 2 | 1 | 1 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 2 | 1 | 1* |
| (iii) | ද්විතියික | සංවර්ධන නිලධාරි | 115 | 103 | 12* |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2 | 0 | 2 |
| | | මාධ්‍ය නිලධාරි *** | 1 | 1 | 0 |
| | | තාක්ෂණ නිලධාරි | 1 | 0 | 1 |
| | | කළමනාකරණ සේවා නිලධාරි | 31 | 16 | 15 |
| | | කළමනාකරණ සහකාර*** | 5 | 5 | 0 |
| (iv) | ප්‍රාථමික | රියැදුරු | 21 | 16 | 5 |
| | | රියදුරු*** | 1 | 1 | 0 |
| | | කාර්යාල කාර්ය සහයක | 20 | 17 | 3* |
| | | කාර්යාල සහායක*** | 2 | 2 | 0 |
| **එකතුව** | | | **230** | **185** | **45** |

*1.2 වගුව*

**සටහන:-**

*** නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ සේවයේ නියුතු නිලධාරිනිය පූර්ණකාලීනව අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇත.**

**** නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරේ සේවයේ නියුතු නිලධාරියකු අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරේ පූර්ණකාලීනව රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇත.**

***** දෙපාර්තමේන්තුගත තනතුරු.**

**•මෙම නිලධාරීන් රා.ප.ච. 14/2022 යටතේ විදේශගත වී ඇති අතර රා.ප.ච. 14/2022 (iv) අනුව එම තනතුරු පුරප්පාඩු ලෙස දක්වා ඇත.**

## 1.5 ආංශික කාර්ය සාධනය

### 1.5.1 පාලන අංශය

උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මඟින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම සහ පවත්වාගැනීම සඳහා අමාත්‍යාංශයේ අභිමතාර්ථ සහ කාර්යයන් වලට ගැලපෙන උසස් තත්ත්වයක් සහිත ප්‍රශස්ථ සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අඛණ්ඩ සහ ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක පහසුකම් නංවාලීම සහ උසස් අධ්‍යාපන අංශයේ සමස්ත පරිපාලනය, මෙහෙයවීම සහ ඇගයීම නංවාලීම පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ.

### 1.5.1.1. පාලන අංශයේ කාර්යභාරය

- දෛනිකව උසස් අධ්‍යාපන අංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලයෙන් හා විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාල පාර්ශව  වෙත යැවීම සඳහා පියවර ගැනීම.
- උසස් අධ්‍යාපන අංශයේ කටයුතු සඳහා අවශ්‍ය  ප්‍රවාහන පහසුකම් සැපයීම.
- උසස් අධ්‍යාපන අංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම,ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම .
- උසස් අධ්‍යාපන අංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි,යන්ත්‍ර සූත්‍ර හා  නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම
- උසස් අධ්‍යාපන අංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- නිලධාරීන්ගේ රාජකාරි  දුරකතන බිල්පත් පියවීම.
- නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර, වීසා,VIP, ගමන් වියදම් හා දීමනා ලබාදීම පිලිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ  සභාගත කිරීම.
- නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම්  සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ණය ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම.
- මාසික දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර ( warrants) නිකුත් කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවලදී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- උසස් අධ්‍යාපන අංශයෙහි  කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම්
- උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය/ රාජ්‍ය අමාත්‍ය/නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම් හා සේවය අවසන් කිරීම්
- බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීමේ අවස්ථා ලබා දීම
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතනයන්හි හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සහනදායී මෝටර් බලපත්‍ර නිකුත් කිරීම.

- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අනධ්‍යාන කාර්ය මණ්ඩල පත් කිරීම හා පුරප්පාඩු පිරවීම.
- විශ්වවිද්‍යාල සඳහා විදේශීය ආචාර්යවරුන් කොන්ත්‍රාත්/ තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම.
- විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද්විතීයන පදනම මත තාවකාලිකව/ ස්ථිරව මුදා හැරීම.
- විශ්වවිද්‍යාල පද්ධතියේ දීමනා සම්බන්ධ මහා භාණ්ඩාගාරය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් විෂමතා පිළිබඳව අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීම.
- විදේශ ආධාර හා ණය මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම  හා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම.

### 1.5.2. මූල්‍ය කළමනාකරණ අංශය

මුදල් රෙගුලාසි වලින් නියම කර ඇති පරිදි අමාත්‍යාංශයක හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල මූල්‍ය පරිපාලනයේ ක්‍රමවත් භාවය හා ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ව අමාත්‍යාංශ ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිවයුතු වේ.

ඒ අනුව අමාත්‍යාංශයක් තුළ මූල්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ද අමාත්‍යාංශ ලේකම්වරයා පාර්ලිමේන්තුවට වගකිවයුතු කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යාංශ ලේකම් වරයාට සහාය වීම මූල්‍ය කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, මූල්‍ය උපදෙස් හා මග පෙන්වීම්, මූල්‍ය සැලසුම්කරණය හා අයවැය, ගිණුම්කරණය හා වාර්තා කරණය, අභ්‍යන්තර පාලනය, වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය කලමනාකරණ උපදෙස් හා සුපරීක්ෂණය යන කාර්යයන් රාජ්‍ය නිවේදිත ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා ව්‍යවස්ථාව මගින් නියම කර ඇති කාර්යභාරයන් වේ.

**2025.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය**

| අයිතමය/විස්තරය | 2025 ශුද්ධ ප්‍රතිපාදනය | ප්‍රතිපාදන | | ප්‍රතිපාදන උපයෝජන |
|---|---|---|---|---|
| | | වියදම | ඉතිරිය | ප්‍රගතිය % |
| පරිපාලන හා ආයතනික සේවා | 3,138 | 2,239 | 899 | 71% |
| පුද්ගල පඩිනඩි | 175 | 174 | 1 | 100% |
| වෙනත් පුනරාවර්තන වියදම් | 2964 | 2,065 | 899 | 70% |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය | 2,483 | 2,445 | 37 | 98% |
| එකතුව | 5,621 | 4,684 | 937 | 83% |

*1.3 වගුව*

### 1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය

### 2025.01.01 සිට 2025.12.31 දක්වා යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- ප්‍රසම්පාදන කාර්යන් 2024 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2025 වර්ෂයට අදාල අයවැය ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.
- ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සැලසී ඇති ප්‍රතිපාදන අනුව කාර්යක්ෂමව හා සඵලදායිව අදාල සේවාවන් සැපයීම.
- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කර එවනු ලබන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යන ආයතනයන්ගෙන් ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමකට ලක්කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ ව්‍යාපෘති යෝජනා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- ව්‍යාපෘතිවලට අදාල රේට් අනුමැතීන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල වෙතින් ලැබෙන ලිපිලේඛණ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා අනුමත කරන ලද ප්‍රමාණ පත්‍ර (BOQ) අදාල විශ්වවිද්‍යාලය වෙත යොමුකිරීම.

### 1.5.3.2 සේවා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් 2025 වර්ෂය තුල දී කරන ලද කාර්යයන්,

### 1. සේවා ප්‍රසම්පාදන

- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු, අමාත්‍යාංශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කර ලබාදීම.
- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කරගැනීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.
- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගෙන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම.

### 2. උපදේශන සේවා

බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු අදාල ඉදිකිරීම් ආරම්භ කිරීම හා අවසන් කිරීම සඳහා දිර්ඝ කාලයක් ගත වන අවස්ථාද, එම ව්‍යාපෘති කාලය මෙන්ම පිරිවැය ද දෙගුණ වූ අවස්ථා ද නිරීක්ෂණය විය. ඒ පිලිබඳ සොයා බැලීමේදී පෙනි ගියේ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ සුළු කාර්යයකදී පවා ඉතා විශාල කාලයක් ගත කර ඇති බවයි.

ඊට පිලියමක් ලෙස අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිකිරීම් වර්ගීකරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව යෝජනා හා මිල ගණන් කැඳවා විශ්වවිද්‍යාල සඳහා අනුමත වන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශකවරුන්ගෙන් ලැයිස්තුවක් සකස් කර විශ්වවිද්‍යාල වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය වෙනුවෙන් අධික කාලයක් වැය කොට විශ්වවිද්‍යාල සඳහා උපදේශකවරු පත්කර ගැනීම වෙනුවට වැඩි කාලයක් ගත නොකට මෙම ලැයිස්තුවෙන් උපදේකවරුන් තෝරා ගෙන කඩිනමින් නිර්මාණ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවකාශ සැලසී ඇත.

### 1.5.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

උසස් අධ්‍යාපන අංශයේ හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එසේම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ කාර්යක්ෂමතාවය හා තත්වය ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන සැකසීම ආදී කටයුතු මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

### 1.5.4.1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය විසින් 2025.01.01 සිට 2025.12.31 දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන විශ්වවිද්‍යාල 17 කින් සහ අනුබද්ධ ආයතන 18කින් සමන්විත සියලු ම අධ්‍යයන, අනධ්‍යයන කාර්යමණ්ඩල වල විදේශීය නිවාඩු අනුමත කිරීම, මාර්ගගත විදේශ නිවාඩු අනුමත කිරීමේ (online foreign leave approval) පද්ධතිය මගින් සිදු කරයි.
- විදේශ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීම මාර්ග ගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය පද්ධතියක් (online management system for scholarships) සකසා ඇති අතර ශිෂ්‍යත්ව අයදුම්කරුවන් හට මේ හරහා ශිෂ්‍යත්ව සඳහා අයඳුම්කල හැක. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ සිදු කිරීම Zoom තාක්ෂණය මඟින් ද සිදු කරයි.
- රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල අංශයේ Online Interest Free Student Loan Management System පද්ධතිය නඩත්තු කිරීම සහ නව අවශ්‍යතාවයන් ඇතුළත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. තවද, Ms Teams තාක්ෂණය යොදා ගනිමින් අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශය මඟින් සිසුන් 4,500කට අධික පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා සම්බන්ධ කර ගැනීම සිදුකරයි.
- තවද, 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ කටයුතු කරනු ලබයි.
- සහනදායි මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමට (Vehicle Permit) පද්ධතියක් සකස් කර ඇත.
- ඉහත පද්ධති නව අවශ්‍යතා අනුව වඩා ඵලදායිව භාවිතා කිරීම සඳහා යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරයි.
- නව අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදී උසස් අධ්‍යාපන අංශයේ ජාලගත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකරයි.
- උසස් අධ්‍යාපන අංශයේ කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගැනීම සම්බන්ධ පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම.
- උසස් අධ්‍යාපන අංශයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි නව තොරතුරු තාක්ෂණ පද්ධති නිර්මාණය කිරීම.

### 1.5.5. සංවර්ධන අංශය

ශ්‍රී ලංකාව තුළ නව රාජ්‍ය විශ්වවිද්‍යාල ස්ථාපනය කිරීම, පවතින විශ්වවිද්‍යාල පුලුල් කිරීමේදී අවශ්‍ය නෛතික පසුබිම සකස්කර දීම හා ඉඩම් අත්පත් කර දීම මඟින් භෞතික සම්පත් සැපයීම මෙම අංශයෙහි වගකීමකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ නියාමනය නොවන භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යන ඒවායෙහි අණ පනත්වලට අදාළ කාර්යයන් සිදුකරනුයේ ද මෙම අංශයෙනි. විශ්වවිද්‍යාලය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අධ්‍යයන කටයුතු, රාජකාරීමය හා පෞද්ගලික කාර්යයන් සඳහා විදේශගත වීමේදී ඒ සඳහා දිවයිනෙන් බැහැර වීමට අවශ්‍ය අනුමැතිය ලබාදීම, විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා උපකරණ ආනයනයේදී අවශ්‍ය නිර්දේශ ලබා දීම මගින් එම කාර්යයන් සඳහා පහසුකම් සපයනු ලබයි.

**නිලධාරී සංඛ්‍යාව**

| අනු අංකය | තනතුරු නාමය | 2025.01.01 දිනට සේවක සංඛ්‍යාව | 2025.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | අතිරේක ලේකම් (සංවර්ධන) | 01 | 01 |
| 02. | අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | 01 | 01 |
| 04. | සංවර්ධන නිලධාරී | 10* | 07** |
| 05. | කළමනාකරණ සේවා නිලධාරී 1 | 02 | 02 |
| 06. | කාර්යාල සේවක සේවය III | 01 | 01 |
| **එකතුව** | | **16** | **13** |

*1.4 වගුව*

* 2025.01.01 දින සිටි සංවර්ධන නිලධාරීන් 10 අතරින් මේ වන විට එක් සංවර්ධන නිලධාරියෙකු පස් අවුරුදු විදේශ නිවාඩු ද එක් නිලධාරියෙකු පස් අවුරුදු දේශීය නිවාඩු ද ලබා ගෙන ඇත.

** 2025.01.01 දිනට සිටි සංවර්ධන නිලධාරීන් 10 අතරින් මේ වන විට නිලධාරිණියන් දෙදෙනෙකු ප්‍රසූත නිවාඩු ලබා ගෙන ඇති අතර එක් නිලධාරියෙකු 2025.02.27 දින ස්ථානමාරු වී පැමිණ ඇත.1.5.5.1 සංවර්ධන අංශයේ කාර්යභාරය

1. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීමේ කටයුතු හා එම පනත යටතේ නව පාඨමාලා ආරම්භ කිරීම, පාඨමාලා වෙනස්කිරීම, නව පීඨ හා අංශ ආරම්භ කිරීම ආදී නියමයන් හා නියමාවලි පළකිරීම.
2. රජයේ විශ්වවිද්‍යාල ස්ථාපනය හා පුලුල් කිරීම සඳහා ඉඩම් පවරා ගැනීම හා අත්පත් කර ගැනීම පිළිබඳ කටයුතු
3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාළ කටයුතු (සේවක සංඛ්‍යා පිළිබඳ කරුණු හැර)
4. ශ්‍රී ලංකා හෙද විශ්වවිද්‍යාලය පිහිටුවීම සම්බන්ධ කටයුතු.
5. රාජ්‍ය විශ්වවිද්‍යාලවල ප්‍රචණ්ඩත්වය හා නවකවදය වැලැක්වීම හා තුරන් කිරීම සඳහා වූ ජාතික කාර්යය සාධන බලකාය සම්බන්ධ අමාත්‍යාංශීය කටයුතු
6. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උපාධි අධ්‍යාපන ආයතනයන්හි පාලක සභා/ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම සහ වෙනත් ආයතනවල කළමනාකරණ මණ්ඩල පාලක සභා නියෝජනය කිරීම සඳහා අමාත්‍යාංශ නියෝජිතයින් පත් කිරීම සම්බන්ධ කටයුතු.

7. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ කටයුතු (සේවක සංඛ්‍යා පිළිබඳ කරුණු හැර)

8. සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අයත් පශ්චාත් උපාධි ආයතන වෙතින් ලැබෙන විදේශ නිවාඩු අයදුම්පත් සඳහා ගරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු.

9. විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු හා ඔවුන්ගේ විදේශ නිවාඩු අයදුම්පත් සඳහා ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු.

10. විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව යානාපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමට අදාළ කටයුතු.

11. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම

12. විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ගුවන් මඟින් ආනයනය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 368 අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු

13. විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ආනයනය කිරීමේදී එවැනි භාණ්ඩ සඳහා තීරුබදු සහ වැට්බදු නිදහස් කිරීම/සහන සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් සඳහා 2021.03.24 දිනැති අංක 2220/42 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අනුමැතිය ලබා ගැනිම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

### 1.5.6. සැලසුම් අංශය

### 1.5.6.1 සැලසුම් අංශයේ කාර්යභාරය

- දේශීය හා විදේශීය ව්‍යාපෘති අනුමත කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර යැවීම හා ඔවුන් විසින් ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් වලට පිළිතුරු යැවීම සඳහා විශ්වවිද්‍යාල සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශීය ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කිරීම හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ණය හා ආධාර දෙන රටවල් සමග මෙන්ම දේශීය ආයතන සමඟ ඇතිවන ගැටලු නිරාකරණය සඳහා අදාළ කටයුතු කිරීම.
- විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක පිහිටුවීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ව්‍යාපෘති සේවක තනතුරු අනුමත කරවා ගැනීම් හා බඳවා ගැනීම් සඳහා පාලන අංශය සමග සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.
- නිම කරනු ලබන විදේශිය ව්‍යාපෘති සඳහා අවසන් ව්‍යාපෘති වාර්තා සකස් කරවා ඒවා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික විගණන කාර්යාලය සහ ව්‍යාපෘතියේ විදේශ අරමුදල් සපයන ආයතනය (donor) වෙත යැවීම.
- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය ප්‍රගති වාර්තා පිළියල කර භාර දීම.

- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය,පාර්ලිමේන්තුව හා මහභාණ්ඩාගාරය විසින් දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව කරනු ලබන විමසීම් වලට අදාළව තොරතුරු හා ප්‍රගති වාර්තා පිළියල කර භාර දීම.

- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම සඳහා විදේශිය ව්‍යාපෘති හා අයවැය යෝජනා ව්‍යාපෘතිවලට අදාළව අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු මූල්‍ය අවශ්‍යතා ලබා ගෙන භාණ්ඩාගාරය වෙත දැනුම් දීම සඳහා ගිණුම් අංශය වෙත ලබා දීම.

- අයවැය කථාවේ දී ඉදිරිපත් කළ යුතු අයවැය යෝජනා සඳහා විශ්වවිද්‍යාල වෙතින් ව්‍යාපෘති යෝජනා ලබා ගැනිම හා අයවැය යෝජනා ලේඛනයට ඇතුළත් කළ යුතු ව්‍යාපෘති යෝජනා ලේඛනය සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත ලබා දීම.

- අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු කිරිම.

- අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කරනු ලබන ආකෘති පත්‍රවලට අනුකූලව ප්‍රගති වාර්තා සකස් කර ලබා දීම.

- විදේශිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව හා විශ්වවිද්‍යාලයන්හි අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරිම, රැස්වීම් වාර්තා පිළියෙල කිරිම, රැස්වීමේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කිරිම හා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරිම.

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව හා අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් හා වෙනත් විශේෂිත රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරිම, රැස්වීම් වාර්තා පිළියෙල කිරිම, රැස්වීමේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කිරිම හා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරිම.

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය සඳහා මෙන්ම එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරිම සඳහා ක්ෂේත්‍රයට ගොස් පරීක්ෂා කිරිම.

- රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය විසින් දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව කරනු ලබන විගණන විමසීම් වලට පිළිතුරු සැපයීම.

- දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන්ම පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව භාෂාත්‍රයෙන්ම පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතනවල වාර්ෂික වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම.

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුසාරයෙන් උසස් අධ්‍යාපන අංශයට ගැලපෙන ලෙස අමාත්‍යාංශයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම, කාර්ය සාධන දර්ශක මත පදනම්ව දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අධීක්ෂණය හා ඊට අදාළ කාර්තුමය ප්‍රගතිය වාර්තා කිරීම.

- අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවල ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.

- වෙනත් රේඛීය අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී අමාත්‍යාංශය නියෝජනය කරමින් දායකත්වය ලබාදීම.
- වාර්ෂිකව සහ අර්ධ වාර්ෂිකව හෝ කලානුරූපීව ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය හා යුනෙස්කෝ ආයතනය මගින් ප්‍රකාශ කරනු ලබන වාර්තාවන් සඳහා දත්ත ලබාදීම.
- මෙරට දී හා විදේශයන්හි දී රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා සඳහා සහභාගී වන දූත මණ්ඩල සාමාජිකයන් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ තොරතුරු සැපයීම.
- තිරසර සංවර්ධන අරමුණු සඳහා වන සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.
- විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි කටයුතු සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කර ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් පවරනු ලබන කටයුතු සිදු කිරීම සහ සංවිධාන කටයුතු සිදු කිරීම.

### 1.5.7. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

උසස් අධ්‍යාපනය සඳහා පවතින ඉහළ ඉල්ලුමට අනුකූලව, සුදුසුකම් ලබන සියලුම අපේක්ෂකයින්ට අධ්‍යාපන අවස්ථා ලබා දීමට රාජ්‍ය විශ්වවිද්‍යාල සතු සීමිත ධාරිතාව ප්‍රමාණවත් නොවේ. එබැවින්, විකල්පයක් ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය හරහා ඔවුන්ට අවස්ථා ලබා දීමේ සාපේක්ෂ වැදගත්කම සලකා බලා, රාජ්‍ය නොවන අංශයේ සංවර්ධනය සහ නියාමනය කිරීමේ වගකීම උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය වෙත සෘජුවම පවරන ලදී. ඒ අනුව, 2013 වසරේ දී රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පිහිටුවනු ලැබී ය.

මීට අමතරව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය අනුව, උසස් අධ්‍යාපන ආයතන උපාධි පිරිනමන ආයතන ලෙස පිළිගැනීමේ කාර්යය සඳහා වන  නිශ්චිත බලධාරියා ලෙස, උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා එම විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. මෙම ක්‍රියාවලියට අදාළ කටයුතු ද මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 01. ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව (SCAQA)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සඳහන් විධිවිධානවලට අනුව, උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාව නිශ්චිත බලධාරියා ලෙස පත් කර ඇත. ඒ අනුව, උපාධි පිරිනමන ආයතන පිළිගැනීමේ ක්‍රියාවලියේ දී තමන්ට සහාය වීම සඳහා නිසි බලධාරියා විසින් ප්‍රතීතනය සහ තත්ත්ව සහතිකකරණය පිළිබඳ ස්ථාවර කමිටුව පත් කර තිබේ. 2025.01.01 සිට 2025.12.31 දක්වා කාලය තුළ එම කමිටුව රැස්වීම් 14 ක් පවත්වා ඇති අතර, එම රැස්වීම්වල දී ගනු ලැබූ තීරණ මෙම අංශය මගින් ක්‍රියාත්මක කර ඇත.

### 1.5.7.1. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

**පසුබිම**

2017 අයවැය යෝජනාවට අනුකූලව, උසස් අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය පුළුල් කිරීමේ මූලික අරමුණ ඇතිව පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (IFSLS) 2017 වසරේදී හඳුන්වා දෙන ලදී. තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා පවතින අවස්ථා පුළුල් කරන අතරම, රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට අත්‍යවශ්‍ය වන ඉහළ නිපුණතාවලින් යුත් මානව ප්‍රාග්ධනයක් ගොඩනැගීම මෙම යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කෙරේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට වරම් නොලබන සහ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙන සිසුන්ට, පිළිගත් උපාධි පිරිනමන ආයතනවල (DAIs) උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පොලී රහිත ණය පහසුකම් ලබා දෙනු ලැබේ. පාඨමාලා ගාස්තු සඳහා ලබා දෙන උපරිම ණය මුදල රුපියල් 1,500,000 කි. මීට අමතරව, ජීවන වියදම් සහ අනෙකුත් ආශ්‍රිත වියදම් පියවා ගැනීම සඳහා රුපියල් 300,000 දක්වා වූ වෛකල්පික ශිෂ්‍යාධාර ණය මුදලක් (Stipend loan) ද ලබා ගත හැකිය.

## 1.6. උසස් අධ්‍යාපන මූල්‍ය ප්‍රගතිය - 2025

2025 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.

| විශ්වවිද්‍යාල හා ආයතන | පුනරාවර්තන | | | ප්‍රාග්ධන | | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2025 (රු.මි.) | | | 2025 (රු.මි.) | | | 2025(රු.මි) | | |
| | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % |
| උසස් අධ්‍යාපන අංශය | 269 | 261 | 97% | 24 | 21 | 87% | 293 | 282 | 96% |
| අයවැය යෝජනා | 2869 | 1978 | 69% | 1,862 | 1,451 | 78% | 4,731 | 3,429 | 72% |
| විදේශ ව්‍යාපෘති | 0 | 0 | | 25,214 | 22,105 | 88% | 25,214 | 22,105 | 88% |
| උසස් තාක්ෂණ ආයතනය | 1364 | 1361 | 100% | 200 | 200 | 100% | 1,564 | 1,561 | 100% |
| බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය | 583 | 567 | 97% | 230 | 139 | 60% | 812 | 705 | 87% |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 536 | 518 | 97% | 343 | 319 | 93% | 879 | 837 | 95% |
| අමාත්‍යාංශයේ මුළු එකතුව | 5,621 | 4,684 | 83% | 27,872 | 24,234 | 87% | 33,493 | 28,918 | 86% |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | * | * | * | * | * | * | * | * | * |
| **මුළු එකතුව** | **5,621** | **4,684** | **83%** | **27,872** | **24,234** | **87%** | **33,493** | **28,918** | **86%** |

*1.5 වගුව*

## 1.7 විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

2025 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උසස් අධ්‍යාපන සඳහා වෙන් වූ මුළු ප්‍රාග්ධන වියදමින් රුපියල් මිලියන 23,718 විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා වෙන් වී ඇත. මේ යටතට ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 23,718 ක ව්‍යාපෘති 09 ක් ඇතුළත් වේ. ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 01 යටතේ දක්වා ඇති අතර ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,000ට වැඩි ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

### 1.7.1 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - නැගෙනහිර විශ්වවිද්‍යාලය

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන **5,480ක්** වන අතර, ඒ අතරින් ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් රුපියල් මිලියන **2,507ක්** වෙන් කර ඇත. 2016 වර්ෂයේ ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂය දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය. 2025 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන **1,207.9ක්** වෙන් කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ **කුවේට් අරමුදලින් ලැබෙන ණය මුදල්** යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කළ පසු, වෛද්‍ය උපාධිය සඳහා වාර්ෂිකව විද්‍යාර්ථීන් **100ක්,** හෙද උපාධිය සඳහා **70ක්**, ඖෂධවේදී උපාධිය සඳහා **20ක්,** සහ මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය සඳහා **20ක්** ලෙස, මෙම පීඨයට වාර්ෂිකව විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීමට හැකි වනු ඇත. එමෙන්ම, මෙම පීඨය යටතේ පහත සඳහන් අධ්‍යයන දෙපාර්තමේන්තු **තුනක් (03)** පිහිටුවීමට සැලසුම් කර ඇත.

I. ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යයන අංශය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය
II. සායනික විද්‍යා අධ්‍යයන අංශය සහ අතිරේක වෛද්‍ය අධ්‍යයන අංශය
III. මානව ජීව විද්‍යා අධ්‍යයන අංශය සහ ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය

### 1.7.2 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වෙළඳපළට අදාළ කුසලතා සහ ව්‍යවසායකත්ව ජවයෙන් සන්නද්ධ තාක්ෂණ-දිශානගත උපාධිධාරීන් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයය කිහිපයක විද්‍යා හා තාක්ෂණ පීඨ සංවර්ධනය කිරීමට රජයට සහාය දැක්වීම ය. එම විශ්වවිද්‍යාලයයවලට කැලණිය විශ්වවිද්‍යාලයය, රජරට විශ්වවිද්‍යාලයය, සබරගමුව විශ්වවිද්‍යාලයය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය මගින් නව්‍ය තාක්‍ෂණය සහ කර්මාන්තයට අදාළ අධ්‍යාපනය හා පර්යේෂණ පහසුකම් සැපයීම, ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීම, කර්මාන්ත ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යයන කාර්ය මණ්ඩලයට උපකාර කිරීම, තරඟකාරී කර්මාන්ත සහ විදේශීය විශ්වවිද්‍යාලයය සහයෝගිතා යෝජනා ක්‍රම හා ධාරිතා සංවර්ධන අවස්ථා ලබා දීම යනාදිය සිදු කෙරේ. අමතරව, යෝජිත නව උසස් අධ්‍යාපන ව්‍යාපෘතියක් සකස් කිරීමේදී රජයට උපකාර කිරීම සඳහා වන සංරචකයක්ද ව්‍යාපෘතිය තුළ ඇතුළත් වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 26,400 කි. (ඇමරිකානු ඩොලර් මිලියන 165) එයින් රු. මිලියන 23,200ක්, ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ සහ ඉතිරි මුදල දේශීය අරමුදල් යටතේ මූල්‍යායනය කිරීමට සැලසුම් කර ඇත. 2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 13,490.30 ප්‍රතිපාදන ලබා දුන් අතර සමස්ථ භෞතික ප්‍රගතිය 85%කි. 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ. මෙම නව පීඨ ඉදිකිරීමෙන් පසු 2023 වර්ෂයේ සිට එක් අධ්‍යයන වර්ෂයක් සඳහා ශිෂ්‍යයින් 1,500 ක් ඇතුළත් කරගැනීමට හැකිවනු ඇත. ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනයෙන් වැඩි ප්‍රතිශතයක් වෙන්වන්නේ පීඨයන් ඉදිකිරීමට හා උපකරණ ලබාදීම සඳහාය. මේ යටතේ විශ්වවිද්‍යාලයය සතර සඳහා හරිත ගොඩනැගිලි ප්‍රමිතීන් අනුව හා කාන්තා හිතකාමී පහසුකම් වලින් සමන්යුත පීඨයන් ඉදිකිරීමට සැලසුම් කර ඇත. එසේම මෙම සෑම පීඨයක් සඳහා අවශ්‍ය රසායනාගර පහසුකම්, උපකරණ මෙම ව්‍යාපෘතිය යටතේ සපයනු ලැබේ.

ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පහතින් දක්වා ඇත.

*1.6 වගුව* **විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පීඨ ඉදිකිරීම්**

රු.මි.

| පීඨ ගොඩනැගිල්ල | ඇස්තමේන්තුගත පිරිවැය | කොන්ත්‍රාත් ප්‍රදානය | සමුච්චිත වියදම* | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය, කැලණිය වි. | 4,079.60 | 3,032.70 | 4,701.55 | 100 | 100 |
| තාක්ෂණ පීඨය, සබරගමුව වි. | 1,941.50 | 1,521.24 | 2,550.84 | 100 | 100 |
| ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර වි. | 4,189.20 | 3,624.96 | 6,092.53 | 100 | 100 |
| තාක්ෂණ පීඨය, රජරට වි. | 2,933.70 | 3,000.00 | 5,600.59 | 100 | 100 |
| තාක්ෂණ පීඨය, මොරටුව වි. | 844.00 | 597.33 | 748.03 | 100 | 100 |
| **එකතුව** | **13,988.00** | **11,776.23** | **19,693.54** | | |

*** මිල වැඩි කිරීමේ වියදම් (price escalation payment) ඇතුළත් වේ.**

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 22ක් සඳහා අරමුදල් ලබා දී ඇති අතර ඒවා දැන් විශ්වවිද්‍යාලයය මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී

### 1.7.4 වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය

සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල (SFD) සෞදි රියාල් 105ක සහන ණයක් යටතේ ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාලයය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඇස්තුමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 28 ක් වේ. "වයඹ විශ්වවිද්‍යාලය නගර සංවර්ධන වැඩසටහන" අවට විශ්වවිද්‍යාලයය ප්‍රජාව සමඟ සමීප අන්තර් ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ශක්තිමත් කිරීම තුළින් සැලකිය යුතු සංවර්ධන බලපෑමක් ඇතිකිරීමේ අරමුණින් යුත් නවතම සංකල්පයකි. මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයයයේ අධ්‍යාපන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම විශ්වවිද්‍යාලයය ආසන්න ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය නංවාලීම සඳහා සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණවන්නේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයය සඳහා දැනුම පදනම් කරගත් ස්වයං විශ්වාස සහ තිරසාර ප්‍රජා අන්තර් ක්‍රියාකාරී පද්ධතියක් ස්ථාපිත කිරීමයි. මෙම විශ්වවිද්‍යාලය නගර සංවර්ධන ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයයයේ කුලියාපිටිය පරිශ්‍රය සහ මාකඳුර පරිශ්‍රය ආවරණය කරයි. 2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,897.00ක ප්‍රතිපාදන ලබා දුන් අතර සමස්ථ භෞතික ප්‍රගතිය 99.26 %කි.



පුස්තකාල ගොඩනැගිල්ල, වයඹ විශ්වවිද්‍යාලය - කුලියාපිටිය පරිශ්‍රය



බහු කාර්ය මධ්‍යස්ථානය, වයඹ විශ්වවිද්‍යාලය - මාකඳුර පරිශ්‍රය

## 1.8. අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 15,490 වටිනාකමකින් යුත් අයවැය යෝජනා ව්‍යාපෘති 10 ක් සඳහා 2025 වර්ෂයේ රුපියල් මිලියන 6,354ක ප්‍රතිපාදන ලබාදී ඇත. ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

### 1.8.1 රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2017 වසරේ අයවැය යෝජනාවක් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 3,195.00 කි. වර්ග මීටර් 8,199ක වපසරියකින් යුක්ත වූ ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 434 ක් වෙන් කර ඇති අතර එම මුදලින් රුපියල් මිලියන 405.39ක් සම්පූර්ණ මුදලම 2025.12.31 වන විට වියදම් කර ඇති අතර 2025.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 1,662.94 කි. පළමු කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ලෙස 2018.01.17 දින රුපියල් මිලියන 187ක මුදලක් ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අඩු ප්‍රගතිය නිසා 2019.12.23 දින පලමු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2020.07.09 වන දින ව්‍යාපෘතිය නව කොන්ත්‍රත් සමාගමකට ප්‍රදානය කරන ලදී. 2025 වසරේ දෙසැම්බර් මස 31 දින වන විට 72% භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇතුලත් කර ගන්නා වෛද්‍ය සිසුන් සංඛ්‍යාව 160 සිට වසරකට සිසුන් 10 බැගින් වසර 4ක් තුලදී සිසුන් 40කින් වැඩි කර වාර්ෂිකව ඇතුලත් කර ගන්නා සිසුන් ගණන 200ක් කිරීමට යෝජිතය.

### 1.8.2 රුහුණ විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 2808 ක් වන අතර ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග අඩි 110,655.64 කි. මෙම ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත්තුව 2019.06.24 දින ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය අවසන් වන විට වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ලබා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම, අධ්‍යන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්, විද්‍යාගාර සහ භෞතික සම්පත් වර්ධනය කිරීම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂිතය. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දී රුපියල් මිලියන 131.7 නිදහස් කර ඇති අතර 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 900 ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2025.12.31 වන විට රුපියල් මිලියන 766.19 ක මුදලක් වියදම් කර ඇති අතර 2025.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 2070.83කි. 2025.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 95%ක මට්ටමක පවතී.

### 1.8.3 රුහුණ විශ්විද්‍යාලයේ නාවුක අධ්‍යයන මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය අගය රු.මිලියන 1168.20ක් වන මෙම ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග මීටර් 4,449 කි. මෙම කොන්ත්‍රාත්තුව 2019.05.28 දින ප්‍රධානය කර ඇත .මෙහි ඉදිකිරීම් කටයුතු ස්ථාන දෙකක සිදුවන අතර හපුගල සිදුවන ඉදිකිරීම් කටයුතු 2019.08.01 වන දින ද මාගාල්ලේ සිදුවන ඉදිකිරීම් කටයුතු 2019.12.01 වන දින ද ආරම්භ කර ඇත. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දී රුපියල් මිලියන 223.83 නිදහස් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයයේ ඉංජිනේරු පීඨය සඳහා නාවුක ඉංජිනේරු සහ නාවුක ගෘහ නිර්මාණ ශිල්පය යන පාඨමාලා සඳහා පහසුකම් සැපයීම, යාත්‍රා ඉදිකිරීමේ කටයුතු සඳහා පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සැපයීම, එම අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂා කරන අතර විශ්වවිද්‍යාලයය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන් 100 දෙනෙකුගෙන් පමණ ඉහල යනු ඇතැයි ද අපේක්ෂා කරයි. 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 113ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2025.12.31 වන විට රුපියල් මිලියන 82.99 ක මුදලක් වියදම් කර ඇති අතර 2025.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 1,018.25 කි. 2025.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 100%ක මට්ටමක පවතී.

### 1.8.4 රුහුණ විශ්විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2019 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය අගය රුපියල් මිලියන 3,000 ක් වන මෙම ව්‍යාපෘතියේ ඉදි කෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග අඩි 117,929.60 කි. මෙම ව්‍යාපෘතිය සඳහා 2020.11.24 දිනැතිව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දී රුපියල් මිලියන 134.69ක් නිදහස් කර ඇත. 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 225 ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2025.12.31 වන විට රුපියල් මිලියන 196.24ක මුදලක් වියදම් කර ඇති අතර 2025.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 2,653.96 කි. 2025.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 100%ක මට්ටමක පවතී.

රුහුණ විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ හා මහාචාර්ය ඒකකයක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඡායාරූප සටහන් පහත දක්වා ඇත.



රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය



රුහුණ විශ්විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

### 1.8.5 සබරගමුව විශ්වවිද්‍යාලයයයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අදියර

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය අදියර 03ක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමෙන් පසුව වසරකට වෛද්‍ය පීඨය සඳහා ඇතුලත් වන ශිෂ්‍ය සංඛ්‍යාව 75 – 100ත් අතර වේ. වෛද්‍ය පීඨයේ සියළුම ඉදි කිරීම් අවසන් වූ පසුව රත්නපුර ශික්ෂණ රෝහලේ යටිතල පහසුකම්, වෛද්‍ය සේවා සැපයීම්, සායනික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සමාජ සුභ සාධනය ඇතුළු සියළුම අංශවල ප්‍රගතියක් අපේක්ෂා කෙරේ.

**පළමු අදියර -** මෙම අදියර දේශීය අරමුදල් යටතේ මූල්‍යනය කරන අතර මුළු පිරිවැය අගය රුපියල් මිලියන 3,070කි. 2025.12.31වන විට ඉදි කිරීම් කටයුතු අවසන් වූ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 268ක් අවසන් බිල්පත් ගෙවීම සඳහා වෙන් කර තිබූ අතර එම මුදලින් 2025.12.31 වන විට රුපියල් මිලියන 255.72ක මුදලක් වියදම් කර ඇති අතර 2025.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 2,011.03කි.

**දෙවන අදියර -** මෙම ව්‍යාපෘතිය සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 50 ක ණය මුදලක් සවුදි සංවර්ධන අරමුදල මඟින් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග මීටර් 46,043 කි. වෛද්‍ය පීඨය සඳහා ගොඩනැගිලි 13 ක් ද රත්නපුර රෝහල තුල ඉදිවන මහාචාර්ය ඒකකයකින් ද සමන්විත වන මුලු ගොඩනැගිලි 14කින් සමන්විත වේ. ණය ගිවිසුම බලපැවැත්වෙන දිනය 2019.12.03 වන අතර එතැන් පටන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ උපදේශන සේවා ආයතනය හා කොන්ත්‍රාත් සමාගම එක්ව අවශ්‍ය ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කරමින් පවතී. 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 6,323ක් වෙන් කර ඇති අතර 2025.12.31 වන එම මුදලින් වියදම් කිරීමේ මූල්‍ය ප්‍රගතිය 78% කි. 2025.12.31 වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 88%ක මට්ටමක පවතී. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2026 වර්ෂයේ ජූලි මස වන විට අවසන් කිරීමට ද 2026.12.31 දින විට ව්‍යාපෘතියේ උපකරණ සහ ගෘහ භාණ්ඩ මිල දී ගැනීම හා සියලු ගෙවීම් සිදු කර ව්‍යාපෘති කටයුතු සම්පූරණයෙන් නිම කිරීමට නියමිතවේ.

**තෙවන අදියර -** දෙවන අදියර ක්‍රියාත්මක වී අවසන් වීමෙන් පසු ඉතිරිවීම් තිබුනහොත් තෙවන අදියර පිලිබඳව සලකා බැලීමට නියමිතය.

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය

## 2. 1. ආංශික ප්‍රගතිය

### 2.1.1. පාලන අංශය

#### 2.1.1.3 පුහුණු වැඩසටහන්

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් 2025 වර්ෂය තුළදී පහත සඳහන් පරිදි දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇති අතර එහි තොරතුරු පහත පරිදි වේ.

**දේශීය පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | අමාත්‍යාංශයෙන් දරණ ලද වියදම (රු.) |
|---|---|---|---|
| දේශීය පුහුණු වැඩසටහන් | 31 | 350 | 691,136.84 |

*2.1 වගුව*

**විදේශීය පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | අමාත්‍යාංශයෙන් දරණ ලද වියදම (රු.) |
|---|---|---|---|
| විදේශීය පුහුණු වැඩසටහන් | 08 | 09 | පවුම් 225<br>$ 1635 |

*2.2 වගුව*

#### 2.1.1.4 සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.02.15 දින නිකුත් කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක.01/2018 හා 2018.06.08 දින නිකුත් කරන ලද 01/2018 (I) චක්‍රලේඛ අනුව මෙම අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේදී සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ අනුව උසස් අධ්‍යාපන අංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා අනෙකුත් උපාධි ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවල, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ජොෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක සේවය කරන සහනදායි මෝටර් රථ බලපත්‍ර ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා ඉහත සඳහන් චක්‍රලේඛ යටතේ 2025 වර්ෂයේදී නිකුත් කරන ලද සහනදායි මෝටර් රථ බලපත්‍ර පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් වේ. (උසස් අධ්‍යාපන අංශය අංක 1001 සිට ඉහළට බලපත්‍ර අංකනය සිදු කරන ලදී.)

| අනු අංකය | විශ්වවිද්‍යාලය/ආයතනය | උසස් අධ්‍යාපන අංශය මඟින් නිකුත් කර ඇති මුළු බලපත්‍ර ගණන |
|---|---|---|
| 01 | උසස් අධ්‍යාපන අංශය | 03 |
| 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 03 |
| 03 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 78 |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 78 |
| 05 | කැලණිය විශ්වවිද්‍යාලය | 65 |
| 06 | රුහුණ විශ්වවිද්‍යාලය | 42 |

| | | |
|---|---|---|
| 07 | කොළඹ විශ්වවිද්‍යාලය | 77 |
| 08 | යාපනය විශ්වවිද්‍යාලය | 59 |
| 09 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 16 |
| 10 | මොරටුව විශ්වවිද්‍යාලය | 35 |
| 11 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 46 |
| 12 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 23 |
| 13 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 51 |
| 14 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 32 |
| 15 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 37 |
| 16 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 19 |
| 17 | සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 23 |
| 18 | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාය | 11 |
| 19 | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 14 |
| 20 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 09 |
| 21 | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 03 |
| 22 | ශ්‍රීපාලි මණ්ඩපය- කොළඹ විශ්වවිද්‍යාලය | 04 |
| 23 | ශ්‍රී ලංකා වවුනියා විශ්වවිද්‍යාලය | 06 |
| 24 | තාක්ෂණික ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය | 08 |
| 25 | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 01 |
| 26 | ත්‍රිකුණාමල මණ්ඩපය- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 07 |
| 27 | වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 01 |
| 28 | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය | 08 |
| 29 | කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය | 07 |
| 30 | ජෛව රසායන,අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | 07 |
| | **මුළු ගණන** | **773** |

*2.3 වගුව*

## 2.1.1.5 රාජකාරි විදේශ ගමන් බලපත්‍ර/ රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර

උසස් අධ්‍යාපන අංශයේ නිලධාරීන් ඇතුලු රාජකාරි විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2025 වර්ෂය තුළ පහත පරිදි රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

| උසස් අධ්‍යාපන අංශයේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | එකතුව |
|---|---|---|
| 01 | 72 | 73 |

*2.4 වගුව*

| අනු අංකය | විශ්වවිද්‍යාලය/ආයතනය | උසස් අධ්‍යාපන අංශය මඟින් නිකුත් කර ඇති මුළු රාජකාරී විදේශගමන් බලපත්‍ර ගණන |
|---|---|---|
| 01 | උසස් අධ්‍යාපන අංශය | 01 |
| 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 02 |
| 03 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 06 |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 04 |
| 05 | කැලණිය විශ්වවිද්‍යාලය | 16 |
| 06 | කොළඹ විශ්වවිද්‍යාලය | 12 |
| 07 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 03 |
| 08 | මොරටුව විශ්වවිද්‍යාලය | 06 |
| 09 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 02 |
| 10 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 04 |
| 11 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 05 |
| 12 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 04 |
| 13 | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 01 |
| 14 | ශ්‍රී ලංකා වවුනියා විශ්වවිද්‍යාලය | 07 |
| | **මුළු ගණන** | **73** |

*2.5 වගුව*

එසේම රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2025 වර්ෂය තුළ පහත පරිදි රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

| විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් වෙත රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | එකතුව |
|---|---|
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 01 |

*2.6 වගුව*

## 4. 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන ආරාධිත ආචාර්යවරුන්ගේ සේවාව ලබා ගැනීම

| විශ්වවිද්‍යාලය හෝ ආයතනය | සංඛ්‍යාව |
|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 06 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 01 |
| යාපනය විශ්වවිද්‍යාලය | 03 |

*2.7 වගුව*

## 5. 2025 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභා

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 81 |
| 2025.12.31 දක්වා තීරණ ලැබී නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 04 |
| පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | 12 |
| පිළිතුරු සපයා ඇති ස්ථාවර නියෝග යටතේ අසනු ලබන ප්‍රශ්න | 10 |
| 2025 වර්ෂය තුළ මහජන පෙත්සම් කාරක සභාවෙන් ලැබුණු ලිපි | 02 |
| 2025 වර්ෂය තුළ වාර්තා යවන ලද මහජන පෙත්සම් කාරක සභා ලිපි | 01 |
| පිළිතුරු සපයා ඇති කල් තැබීමේ යෝජනා සංඛ්‍යාව | 01 |
| උසස් අධ්‍යාපන විෂය පථයට අදාලව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න | 04 |

*2.8 වගුව*

## 6. තොරතුරු පනත අනුව ක්‍රියා කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධව 2025 වර්ෂය තුළ ක්‍රියා කිරීම පහත සාරාංශ කර ඇත.

| වර්ෂය තුළදී ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව | සපයන ලද තොරතුරු ප්‍රමාණය | වෙනත් ආයතන වෙත යොමු කරන ලද තොරතුරු ප්‍රමාණය | 2025 වර්ෂයේ අභියාචන සංඛ්‍යාව |
|---|---|---|---|
| 41 | 32 | 04 | 02 |

*2.9 වගුව*

## 7. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ වාර්ෂික ගිණුම් හා පාලන වාර්තා

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනද ඇතුළුව ආයතන 39ක 2025.12.31 දින වන විට වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

| ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවට අදාළ වර්ෂය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| **2023** | පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා | 36 |
| | පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා | 03 |
| **2024** | පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා | 05 |
| | පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා | 02 |
| | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා | 05 |
| | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා | 02 |
| | අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිරීක්ෂණ අනුව සකස් කර භාෂාත්‍රයෙන් එවීමට ලිපි යවා ඇති වාර්ෂික වාර්තා | 25 |

*2.10 වගුව*

## 8. ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ඇතුළු සියළුම නඩත්තු වියදම්

| කාර්යය | 2025 වසරේදී දරන ලද වියදම (රු.) |
|---|---|
| ආරක්ෂක සේවා | 7,326,840.02 |
| සනීපාරක්ෂක සේවා | 4,870,273.00 |
| තැපැල | 692903.85 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 4,689,985.48 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම් | 8,094,665.78 |
| විදුලිය | 7,657,171.33 |
| ජලය | 690,246.35 |
| කාර්යාල දුරකථන හා ෆැක්ස් | 1,527,068.61 |
| අමාත්‍යාංශ අන්තර්ජාල සම්බන්ධතා | 3,920,614.95 |
| වරිපනම් | 690,228.00 |
| පුවත්පත් මිලදී ගැනීම | 136,175.00 |
| පානීය ජල බෝතල් | 219,420.00 |
| නවකවදය වැළැක්වීමේ වැඩසටහන සඳහා ලබා දී ඇති දුරකථන බිල්පත පියවීම. 076-5453454 | 14,210.68 |

*2.11 වගුව*

## 9. ප්‍රවාහන පහසුකම් සැපයීම

2025 වර්ෂයේදි අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.

| කාර්යය | 2025 වර්ෂයේ වියදම (රු.) |
|---|---|
| සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම හා අතිරේක ඉන්ධන සැපයීම | 4,990,711.53 |
| වාහන සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම | 10,946,547.21 |
| නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම, අතිරේක ඉන්ධන ලබා දීම හා ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම | 6,946,401.40 |
| වාහන රක්ෂණය කිරීම හා අදාළ බලපත්‍ර ලබා දීම සම්බන්ධ කටයුතු | 948,939.35 |
| දුම් පරීක්ෂණ | 24,300.00 |
| රියදුරන් සඳහා අතිකාල හා ගමන් වියදම් | 2,746,510.00 |
| වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි හා අනෙකුත් උපාංග සපයා දීම | 1,116,358.00 |
| **එකතුව** | **27,719,767.49** |

*2.12 වගුව*

## 10. ණය

2025 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර

| ණය/අත්තිකාරම් වර්ගය | නිලධාරීන් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 93 | 21,234,306.80 |
| විශේෂ අත්තිකාරම් | 43 | 172,000.00 |
| උත්සව අත්තිකාරම් | 84 | 840,000.00 |
| **එකතුව** | | **22,246,306.80** |

*2.13 වගුව*

## 2.1.2. ගිණුම් අංශය

**2025 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.**

**රු. 000'**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 3,950,000 | 5,620,745 | 4,684,108 | 83% |
| ප්‍රාග්ධන | 27,700,000 | 27,872,105 | 24,233,632 | 87% |
| එකතුව | 31,650,000 | 33,492,850 | 28,917,741 | 86% |

*2.14 වගුව*

| විශ්වවිද්‍යාල හා ආයතන | පුනරාවර්තන | | | ප්‍රාග්ධන | | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2025 (රු.මි.) | | | 2025 (රු.මි.) | | | 2025(රු.මි) | | |
| | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % | වෙන් කිරීම | වියදම් | % |
| උසස් අධ්‍යාපන අංශය | 269 | 261 | 97% | 24 | 21 | 87% | 293 | 282 | 96% |
| අයවැය යෝජනා | 2869 | 1978 | 69% | 1,862 | 1,451 | 78% | 4,731 | 3,429 | 72% |
| විදේශ ව්‍යාපෘති | 0 | 0 | | 25,214 | 22,105 | 88% | 25,214 | 22,105 | 88% |
| උසස් තාක්ෂණ ආයතනය | 1364 | 1361 | 100% | 200 | 200 | 100% | 1,564 | 1,561 | 100% |
| බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය | 583 | 567 | 97% | 230 | 139 | 60% | 812 | 705 | 87% |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 536 | 518 | 97% | 343 | 319 | 93% | 879 | 837 | 95% |
| අමාත්‍යාංශයේ මුළු එකතුව | 5,621 | 4,684 | 83% | 27,872 | 24,234 | 87% | 33,493 | 28,918 | 86% |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | * | * | * | * | * | * | * | * | * |
| **මුළු එකතුව** | **5,621** | **4,684** | **83%** | **27,872** | **24,234** | **87%** | **33,493** | **28,918** | **86%** |

*2.15වගුව*

**2025.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය**

| අයිතමය/විස්තරය | **2025** ශුද්ධ ප්‍රතිපාදනය | ප්‍රතිපාදන | | ප්‍රතිපාදන උපයෝජන |
|---|---|---|---|---|
| | | වියදම | ඉතිරිය | ප්‍රගතිය % |
| පරිපාලන හා ආයතනික සේවා | 3,138 | 2,239 | 899 | 71% |
| පුද්ගල පඩිනඩි | 175 | 174 | 1 | 100% |
| වෙනත් පුනරාවර්තන වියදම් | 2964 | 2,065 | 899 | 70% |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය | 2,483 | 2,445 | 37 | 98% |
| එකතුව | **5,621** | **4,684** | **937** | **83%** |

*2.16වගුව*

**2025.12.31 දිනට මූලධන වියදම් සාරාංශය**

| අයිතමය/විස්තරය | 2025ශුද්ධ ප්‍රතිපාදනය | ප්‍රතිපාදන | | ප්‍රතිපාදන උපවයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | | වියදම | ඉතිරිය | |
| පරිපාලන හා ආයතනික සේවා | 1,886 | 1,471 | 414 | 78% |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 9 | 6 | 3 | |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 14 | 14 | 0 | |
| සේවක පුහුණු වැඩසටහන් | 1 | 0.7 | 0.3 | 68% |
| රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 434 | 405 | 29 | 93% |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 190 | 0 | 190 | 0% |
| කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 900 | 766 | 134 | 85% |
| රුහුණු විශ්වවිද්‍යාලයේ සාගර හා නාවික කටයුතු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 113 | 83 | 30 | 73% |
| රුහුණ විශ්වවිදයාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සංවර්ධනය කිරීම | 225 | 196 | 29 | 87% |
| | | | | |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 25,214 | 22,105 | 3,109 | 88% |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 1480 | 834 | 646 | 72% |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 1,897 | 1,535 | 362 | 81% |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 13,419 | 13,474 | 16.04 | 100% |
| මඩකලපුව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකිරීම | 300 | 0 | 300 | 0% |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 6,323 | 4,938 | 1,385 | 78% |
| මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 37 | 0 | 37 | 0% |
| උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේධාරිතා වර්ධන කාර්ය මණ්ඩල පුහුණුව(එරාස්මස්) | 16 | 13 | 3 | 83% |
| විදේශ ව්‍යාපෘති ප්‍රදාන | 75 | 47 | 28 | 63% |
| වියලි කලාපීය කෘෂිකර්මයේ පර්යේෂණ සහ අධ්‍යාපන ධාරිතා වැඩිදියුණු කිරීම යාපනය විශ්වවිද්‍යාලය | 100 | 0 | 100 | 0% |
| කොළඹ විශ්වවිදයාලයේ වෛද්‍ය පීඨයේ මහල් 17ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 1084 | 1083 | 0 | 100% |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 212 | 179 | 33 | 85% |
| ඉහල ශ්‍රේණිගත විදේශ විශ්වවිද්‍යාලයක උපාධි අපේක්ෂක ශිෂයත්ව වැඩසටහන | 200 | 2 | 198 | 1% |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය | 772.5 | 657 | 115 | 85% |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 200 | 200 | 0 | 100% |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 343 | 319 | 24 | 93% |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 230 | 139 | 91 | 60% |
| **එකතුව (මූලධන වියදම්)** | **27,872** | **24,234** | **3,638** | **87%** |

*2.17 වගුව*

**2025 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර**

| ණය/අත්තිකාරම් වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 107 | 21,234,306.80 |
| විශේෂ අත්තිකාරම් | 43 | 172,000.00 |
| උත්සව අත්තිකාරම් | 84 | 840,000.00 |
| වාහන ණය | - | - |
| එකතුව | 234 | 22,246,306.80 |

*2.18 වගුව*

**2025 වර්ෂය සඳහා අක්මුදල් ලැබීම් විස්තර**

| අග්‍රිම ගිණුම් අංකය | භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ප්‍රමාණය (රු.) | වියදම් කරන ලද ප්‍රමාණය (රු.) | අක් මුදල් භාවිතයේ ප්‍රගතිය<br>% |
|---|---|---|---|
| 7002/0000/00/0254/00/0025000 | 7,586,985,149.72 | 7,478,447,750.05 | 98.57% |
| 7003/0000/00/0090/00/0025000 | 834,135,841.41 | 834,079,151.41 | 99.99% |
| **එකතුව** | **8,421,120,991.13** | **8,312,526,901.46** | **98.71%** |

*2.19 වගුව*

**2025 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම**

| | වියදම (රු.) | ලැබීම් (රු.) | හර ශේෂ (රු.) |
|---|---|---|---|
| 2025.12.31 දිනට සත්‍ය අගයන් | 23,810,236.41 | 12,708,886.61 | 39,530,286.89 |

*2.20 වගුව*

**2025.12.31 දිනට මූල්‍ය නොවන වත්කම්**

(රු.)

| වත්කම් කේතය | කේත විස්තරය | **2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂයශේෂය | **2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 76,922,000.00 | 76,922,000.00 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 442,414,493.47 | 442,414,493.47 | - | 100% |
| 9153 | ඉඩම් | 794,700,000.00 | 794,700,000.00 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 1,755,000.00 | 1,755,000.00 | - | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |
| | **එකතුව** | **1,315,791,493.47** | **1,315,791,493.47** | **0.00** | **100%** |

*2.21 වගුව*

**ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය හා ගිණුම්කරණ කාර්යයන්**

| | කාර්යය | ක්‍රියාත්මක කල යුතු දිනය / කාල සීමාව | ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|---|
| 01 | මු.රෙ. 135 අනුව මූල්‍ය අධිකාරී බලය පැවරීම | 2025 වර්ෂය සඳහා අදාළ අධිකාර බලය ලේකම්වරයාගේ අත්සනින් පවරා ඇත. | |
| 02 | රු. 500,000/-ට වැඩි මූලධන වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම | 1971 අංක 38 මුදල් පනත අනුව අධිකාරී බලය පැවරීමට කටයුතු කර ඇත. | |
| 03 | 2025 වාර්ෂික ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2026.02.28 දිනට පෙර | 2026.02.27 |
| 04 | 2025පොදු තැන්පත් ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2026.02.28 දිනට පෙර | 2026.02.27 |
| 05 | 2025 රජයේ නිලධාරීන්ගේ ණය අත්තිකාරම් බී ගිණුම සකස්කර විගණකාධිපතිට ඉදිරිපත් කිරීම | 2026.02.28 දිනට පෙර | 2026.02.26 |
| 06 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2026.03.31 දිනට පෙර | |
| 07 | බැංකු සැසඳුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම | සෑම මසකම 15 දිනට පෙර | නිවැරදිව ඉදිරිපත් කර ඇත. |

*2.22 වගුව*

- 2025 වර්ෂයේ විගණකාධිපති විසින් විගණන විමසුම් 09ක් ඉදිරිපත්කර ඇති අතර එම විමසුම් 09 සඳහා නියමිත කාලයේදී පිළිතුරු යවා ඇත.

- 2023 වර්ෂයේ විගණකාධිපති විසින් විගණන විමසුම් 05ක් ඉදිරිපත්කර ඇති අතර එම විමසුම් 05 සඳහා නියමිත කාලයේදී පිළිතුරු යවා ඇත.

- ගිණුම් අංශය මගින් මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම, වාර්ෂික ප්‍රතිපාදන වෙන්කර දීම, මාසික අග්‍රිම අවශ්‍යතාවයන්ට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන අදාළ ආයතන වෙත නිකුත් කිරීම, අතුරු අග්‍රිම පවත්වා ගෙන යාම, අග්‍රිම සැසඳීම් සිදුකිරීම, පොදු තැන්පත් ගිණුම් හා ණය අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම, වවුචර් සඳහා ගෙවීම් කිරීමේ කාර්යයන්, සරප් කටයුතු ආදී දෛනික හා මාසික කාර්යයන් කාලානුරූපව අප්‍රමාදව ඉටුකර ඇත.

## 2.1.3. ප්‍රසම්පාදන අංශය

2025 වර්ෂය තුල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් රු. මිලි.2097 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක ප්‍රසම්පාදන ආරම්භ කර ඇත.

| අංකය | විශ්ව විද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ව්‍යාපෘති කාලය (මාස) | ව්‍යාපෘති වටිනාකම රු. මි |
|---|---|---|---|---|---|---|
| 1 | නැගෙනහිර විශ්වවිද්‍යාල සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ව්‍යාපෘතිය | නැගෙනහිර විශ්වවිද්‍යාල සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ව්‍යාපෘතිය - අදියර IV | 25.01.06 | 25.07.15 | 12 | 1475 |
| 2 | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි | කොළඹ කාර්යාලය සඳහා මහල් පහක් ගොඩනැගිල්ලක් ඉදිකිරීම (ඉතිරි වැඩ නිම කිරීම) | 25.02.03 | 25.10.01 | 24 | 622 |

*2.23වගුව*

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් රු.මි.1475 ක ව්‍යාපෘතියක් පිරිනමා ඇත.

| අනු අංකය | විශ්වවිද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ප්‍රසම්පාදන අවසන් කිරීම | ව්‍යාපෘති වටිනාකම රු. මි. |
|---|---|---|---|---|---|---|
| 1 | නැගෙනහිර විශ්වවිද්‍යාල සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ව්‍යාපෘතිය | නැගෙනහිර විශ්වවිද්‍යාල සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ව්‍යාපෘතිය -අදියර IV | 25.01.06 | 25.07.15 | 25.11.10 | 1475 |

*2.24 වගුව*

## 2.1.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### 2.1.4.1 අමාත්‍යාංශයේ වෙබ් අඩවියට තොරතුරු ඇතුළත් කිරීම් හා යාවත්කාලීන කිරීම්

| අංක | අංශය | තොරතුරු | ප්‍රමාණය (භාෂා ත්‍රිත්වයෙන්) |
|---|---|---|---|
| 1 | සංවර්ධන අංශය | දේශීය හා විදේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව ,රාජ්‍ය සේවකයන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව දැන්වීම. | 48 |
| 2 | ප්‍රසම්පාදන | ටෙන්ඩර් දැන්වීම් පලකිරිම. | 04 |
| 3 | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි පාඨමාලා ලැයිස්තු. | 18 |
| 4 | ශිෂ්‍ය ණය අංශය | ශිෂ්‍ය ණය ව්‍යාපෘතිය | 02 |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය *2.25 වගුව*

### 2.1.4.2 අමාත්‍යාංශයේ එක් එක් අංශයන් වෙත සේවා සැපයීම් (2025.01.01 සිට 2025.12.31 දක්වා)

| අංක | සේවා සැපයුම් විස්තරය | වාර්තා කරන ලද හා නිරාකරණය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව 2024.06.30 සිට 2025.09.30 දක්වා ) |
|---|---|---|
| 1 | මෘදුකාංග ගැටළු | 213 |
| 2 | දෘඩාංග ගටළු | 202 |
| 3 | අන්තර්ජාල , ජාලකරණ සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු | 317 |
| 4 | පද්ධති සම්බන්ධ ගැටළු | 12 |

*2.26 වගුව*

## 2.1.5. සංවර්ධන අංශය

**1. කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත් කිරීම** (2025.01.01 සිට 2025.12.31 දක්වා)

| අනු අංකය | විශ්වවිද්‍යාලය | කුලපති | සේවා කාලය | උප කුලපති | සේවා කාලය |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක පූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මාහිමිපාණන් වහන්සේ | 2025.06.01<br>2027.05.31 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තේගොඩ සද්ධාරතන අනුනාහිමිපාණන් වහන්සේ | 2024.06.28<br>2027.06.27 |
| 2. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥානරතනාභිධාන මහානායක මහාහිමිපාණන් වහන්සේ | 2024.01.16<br>2026.01.15 | විශ්‍රාමික මහාචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2025.04.25<br>2028.04.24 |
| 3. | නැගෙනහිර විශ්වවිද්‍යාලය | ආචාර්ය එම්.සෙල්වරාජ් මහතා (මියගොස් ඇත). | 2022.06.02<br>2027.06.01 | මහාචාර්ය පී. පර්තීපන් මහතා (Prof. Peratheepan) | 2025.05.24<br>2028.05.23 |
| 4. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | මහාචාර්ය ජයන්ත බලවර්ධන මහතා | 2023.10.09<br>2028.10.08 | මහාචාර්ය කෝලිත බී. විජේසේකර මහතා | 2023.11.02<br>2026.11.01 |
| 5. | කැලණිය විශ්වවිද්‍යාලය | කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්යය පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2021.11.05<br>2026.11.04 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති රේණුකා ද සිල්වා මිය | 2023.08.24<br>2026.08.23 |
| 6. | යාපනය විශ්වවිද්‍යාලය | මහාචාර්ය රාජරත්නම් කුමාරවඩිවෙල් මහතා<br>) | 2025.08.27<br>2030.08.26 | මහාචාර්ය එස්. ශ්‍රී සත්කුණරාජා මහතා | 2023.08.24<br>2026.08.23 |
| 7. | වයඹ විශ්වවිද්‍යාලය | ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය මහතා | 2023.08.04<br>2028.08.03 | මහාචාර්ය ඊ.එම්.පී. ඒකනායක මහතා | 2025.11.21<br>2028.11.20 |
| 8. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2023.02.19<br>2028.02.18 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල් මහතා | 2023.07.26<br>2026.07.25 |
| 9. | සබරගමුව විශ්වවිද්‍යාලය | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර නායක ස්වාමීන් වහන්සේ | 2021.01.01<br>2025.12.31 | මහාචාර්ය එම්. සුනිල් ශාන්ත මහතා | 2023.11.02<br>2026.11.01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10. | සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා | 2023.04.03<br>2028.04.02 | මහාචාර්ය රොහාන් නෙත්සිංහ මහතා | 2023.10.12<br>2026.10.11 |
| 11. | මොරටුව විශ්වවිද්‍යාලය | මහාචාර්ය මොන්ටි කාසිම් මහතා | 2023.10.09<br>2028.10.08 | මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන මහතා | 2023.09.03<br>2026.09.02 |
| 12. | රුහුණ විශ්වවිද්‍යාලය | ධර්ම කීර්ති ශ්‍රී ආචාර්ය පූජ්‍ය අකුරටියේ නන්ද නාහිමිපාණන් වහන්සේ | 2024.11.20<br>2029.11.19 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. ජයන්ත මහතා | 2025.03.08<br>2028.03.07 |
| 13. | කොළඹ විශ්වවිද්‍යාලය | ශාසන කීර්ති ශ්‍රී බුද්ධශාසන සෝභන පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ | 2021.11.17<br>2026.11.16 | මහාචාර්ය අයි.එම්. කරුණාතිලක මහතා | 2025.05.23<br>2028.05.22 |
| 14. | රජරට විශ්වවිද්‍යාලය | ගෞරව ශාස්ත්‍රවේදී, පණ්ඩිත පූජ්‍ය ඊතල වැටුණුවැවේ ඥාණතිලක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2025.04.22<br>2030.04.21 | ආචාර්ය ජනක පුෂ්පකුමාර මහතා වැඩ බලන උපකුලපති ලෙස කටයුතු කරයි. | - |
| 15. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | මහාචාර්ය එම්.ඒ.කේ. ලක්ෂ්මන් දිසානායක මහතා | 2025.07.16<br>2030.07.15 | මහාචාර්ය ඩබ්.එම්.ටී. මධුජිත් මහතා | 2024.08.01<br>2027.07.31 |
| 16. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | ආචාර්ය එම්.ඒ. උපාලි මාම්පිටිය මහතා | 2025.10.30<br>2030.10.29 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.එම්.සී තිලකරත්න මහතා | 2024.06.23<br>2027.06.22 |
| 17. | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | ෆයිස් මුස්තාපා මහතා | 2022.11.19<br>2027.11.18 | මහාචාර්ය එස්.එම්. ජුනායිදීන් මහතා | 2025.05.24<br>2028.05.23 |
| 18. | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | සාහිත්‍ය චක්‍රවර්ති ආචාර්යය පූජ්‍ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | 2021.03.01<br>2026.02.28 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.ඩබ්.කේ. වසන්තා සුබසිංහ මිය (වැඩබලන උපකුලපති). | 2025.06.09 දින සිට වැඩ බැලීම සඳහා පත් කර ඇත. |
| 19. | වවුනියා විශ්වවිද්‍යාලය | විශ්‍රාමික මහාචාර්ය සුබ්‍රමනියම් මෝහනදාස් මහතා | 2021.08.01<br>2026.07.31 | මහාචාර්ය අරුලම්පලම් අත්පුතරාජා මහතා. | 2024.07.08<br>2027.07.07 |

*2.27 : වගුව කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත්කිරීම*

## 2. විශ්වවිද්‍යාල නිලධාරීන් දිවයිනෙන් බැහැරවීම සඳහා අනුමැතිය

| විශ්වවිද්‍යාලය/ ආයතනය | රාජකාරි නිවාඩු | පෞද්ගලික නිවාඩු | එකතුව |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 419 | 302 | 721 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 339 | 225 | 564 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 225 | 209 | 434 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 76 | 197 | 273 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 183 | 275 | 458 |

| | | | |
|---|---|---|---|
| රුහුණු විශ්වවිද්‍යාලය | 187 | 91 | 278 |
| යාපනය විශ්වවිද්‍යාලය | 120 | 171 | 291 |
| විවෘත විශ්වවිද්‍යාලය | 53 | 74 | 127 |
| වයඹ විශ්වවිද්‍යාලය | 46 | 51 | 97 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 48 | 84 | 132 |
| රජරට විශ්වවිද්‍යාලය | 72 | 29 | 101 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 28 | 39 | 67 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 107 | 42 | 149 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 29 | 54 | 83 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 34 | 16 | 50 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 42 | 24 | 66 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 24 | 13 | 37 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 11 | 07 | 18 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 18 | 22 | 40 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය - නැගෙනහිර විශ්වවිද්‍යාලය | 16 | 20 | 36 |
| ත්‍රිකුණාමල මණ්ඩපය-නැගෙනහිර විශ්වවිද්‍යාලය | 09 | 09 | 18 |
| කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA) පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 03 | - | 03 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS) ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 01 | 01 | 02 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 01 | - | 01 |
| ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය | 09 | 06 | 15 |
| කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක ආයතනය (UCSC) | 05 | 06 | 11 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය (PGIPBS) කැලණිය විශ්වවිද්‍යාලය | 03 | 13 | 16 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)- කොළඹ විශ්වවිද්‍යාලය | - | 10 | 10 |
| ජෛව රසායනය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්‍ෂණ ආයතනය (IBMBB) කොළඹ විශ්වවිද්‍යාලීය | 05 | 05 | 10 |
| මානව සම්පත් සංවර්ධන ආයතනය (IHRA) කොළඹ විශ්වවිද්‍යාලීය | 08 | 05 | 13 |
| ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය (NILIS) කොළඹ විශ්වවිද්‍යාලීය | - | 01 | 01 |
| දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PGIIM) | 02 | - | 02 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය - ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 18 | 04 | 22 |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය - (PGIE) - විවෘත විශ්වවිද්‍යාලය | 01 | 01 | 02 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR) | 01 | 01 | 02 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | - | 18 | 18 |
| මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) | 01 | 19 | 20 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව -UGC | 11 | 09 | 20 |
| එකතුව | **2155** | **2053** | **4208** |

*2.28 වගුව*

**3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයන්හි පීඨ සහ අධ්‍යයන අංශ පිහිටුවීම සම්බන්ධ ගැසට් පත්‍ර**

**(2025.01.01 සිට 2025.12.31 දක්වා)**

| අනු අංකය | විශ්වවිද්‍යාලය | පිහිටුවන ලද පීඨය | පිහිටුවන ලද අධ්‍යනාංශය | ගැසට් අංකය හා දිනය |
|---|---|---|---|---|
| 01. | වයඹ විශ්වවිද්‍යාලය | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | "ව්‍යවහාරික පෝෂණ අධ්‍යයන අංශය" වෙනුවට "පෝෂණය හා ආහාරවේදය අධ්‍යයන අංශය" ලෙස සංශෝධනය කිරීම. | 2418/26 2025.01.08 |
| 02 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතාවේද සහ ප්‍රතිශක්තිවේද ආයතනය ස්ථාපිත කිරීම හා ශ්‍රී "ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතාවේද සහ ප්‍රතිශක්තිවේද ආයතන" යන නාමය සහ අභිධානය පවරාදීම | 2424/58 2025.02.20 |
| 03. | නැගෙනහිර විශ්වවිද්‍යාලය | කලා හා සංස්කෘතික කටයුතු පීඨය | 1. අරාබි භාෂා අධ්‍යයනාංශය<br>2. ඉස්ලාමීය අධ්‍යයනාංශය<br>3. ලලිත කලා අධ්‍යයනාංශය<br>4. භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | 2465/11 2025.12.03 |

*2.29 වගුව*

## 2.1.6. විදේශ අධ්‍යාපන අංශය

**ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**1. ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ අධ්‍යාපන අවස්ථාවන් ලබා දීම**

විදේශීය රාජ්‍යයන් විසින් මෙන්ම අධ්‍යාපනික ආයතන මඟින් ශ්‍රී ලංකාව වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවස්ථාවන් පිළිබඳ තොරතුරු භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත් මඟින් හා අපගේ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මඟින් ප්‍රචාරය කරනු ලබන අතර අංශයේ නිල Facebook පිටුව හරහා ද ප්‍රචාරය කරනු ලබයි. එසේම 2022 වසරේ සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම සිදුකර විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් යටතේ සිසුන් තෝරා ගැනීම සිදුකරයි. ඒ හරහා තැපැල මඟින් ගෙන්වා ගැනීමේදී සිදුවිය හැකි ප්‍රමාදයන් වලක්වා ගනිමින් කාර්යක්ෂමව එම කාර්යයන් ඉටු කිරීමට ඉන් අවකාශ සැලසේ.

- 2019 වසරේ සිට බාහිර පාර්ශවයන් සමඟ කරනු ලබන ලිපි ගනුදෙනු වලින් බොහෝ ප්‍රමාණයක් විද්‍යුත් තැපැල මඟින් සිදු කරනු ලබයි.
- 2019 වසරේ සිට අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශ සිසුන් සහ මෙරටට පැමිණෙන විදේශ ආචාර්යවරුන් සඳහා ඇතුළත්වීමේ වීසා (Entry Visa) සහ මෙරටට පැමිණීමෙන් පසුව අදාළ කාලසීමාවට අනුව නේවාසික වීසා (Residence Visa) වලට අදාළ තොරතුරු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලබා දීම සිදු කරනු ලැබේ.

ඒ අනුව ශ්‍රී ලාංකික සිසුන් සඳහා පහත පරිදි ශිෂ්‍යත්ව අවස්ථාවන් ලබා දෙන ලදි.

**ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2021 - 2025 දක්වා**

| ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2021 – 2025.12.31 | | | | | |
|---|---|---|---|---|---|
| රට | වසර | | | | |
| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| ඉන්දියාව | 32 | 37 | 44 | 11 | 27 |
| චීනය | | | | | - |
| කියුබාව | - | - | - | 05 | 1 |
| ජපානය | - | 1 | 1 | 01 | සිසුන් තෝරාගැනීමේ තරග විභාගය අවසන් කර නාම යෝජනා යොමුකර ඇත |
| සර්බියාව | | | | | - |
| හංගේරියාව | - | 1 | 2 | 05 | 8 |
| අසර්බයිජානය | | | | | 1 |
| වියට්නාමය | | | | | 1 |

*2.30වගුව*

| පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2021– 2025.12.31 | | | | | |
|---|---|---|---|---|---|
| රට | වසර | | | | |
| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| ඉන්දියාව | 56 | 6 | 28 | 67 | 59 |
| චීනය | 13 | 7 | 30 | 24 | 30 |
| ජපානය | - | 7 | 7 | 08 | නාම යෝජනා 08 ක් ජපන් තානාපති කාර්යාලය වෙත යොමුකර ඇත. |
| එක්සත් රාජධානිය | 5 | 3 | 2 | 2 | 04 |
| අසර්බයිජානය | - | - | 12 | 12 | 01 |
| සිංගප්පූරුව (NUS) | 56 | 6 | 28 | 67 | නාම යෝජනා 41ක් National University of Singapore වෙත යොමුකර ඇත. |
| හංගේරියාව | 13 | 7 | 30 | 24 | 12 |

*2.31 වගුව*

එසේම උක්ත ශිෂ්‍යත්ව අවස්ථාවන්ට අමතරව සෘජුව අයදුම් කල හැකි විදේශීය ශිෂ්‍යත්ව අවස්ථා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම මගින් සිසුන් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

## 2. විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව සැලසීම

### 2.1 ක්වීන් එළිසබෙත් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලංකාව තුළ පශ්චාද් උපාධි අධ්‍යාපන අවස්ථා තවදුරටත් ලබාදීම සඳහා 2014 වර්ෂයේදී "ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන" පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන 2019 වර්ෂයේදී "ක්වීන් එළිසබෙත් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන" ලෙස සංශෝධනය කරන ලදී.

ඒ අනුව, මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2014 වර්ෂයේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය යන ආයතන වාර්ෂිකව පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

**ලියාපදිංචි මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව**

| අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2014 | 02 |
| 2015 | - |
| 2016 | 02 |
| 2017 | 03 |
| 2018 | 02 |
| 2019 | 02 |
| 2020 | 02 |
| 2021 | 01 |
| 2022 | 02 |
| 2023 | 02 |
| 2024 | 02 |
| 2025 | 01 |
| **එකතුව** | **21** |

*2.32 වගුව*

ඒ අනුව, ක්වීන් එළිසබෙත් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වනවිට ශිෂ්‍යත්වලාභී මුළු පශ්වාත් උපාධි සිසුන් සංඛ්‍යාව 21 කි. පශ්චාත් උපාධි සාර්ථකව හදාරන ලද සිසුන් පහළොස් දෙනෙකු (15) මේ වනවිට තම රටවලට පිටත්ව ගොස් ඇති අතර තවත් සිසුන් තිදෙනෙකු (03) පාඨමාලා හැරගොස් ඇත. සිසුන් තිදෙනෙකු මේ වනවිට පාඨමාලා හදාරමින් සිටී.

එසේම, පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සංගමය විසින් 2025/26 අධ්‍යයන වර්ෂය සඳහා ද අයදුම්පත් කැඳවා ඇති අතර සිසුන් තෝරා ගැනීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇත. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සුදුසුකම් ලැබූ සිසුන් දෙදෙනා මෙරටට ගෙන්වා ගැනීම සඳහා සිදු කළ යුතු කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතියි.

## 3. වෙනත් ශිෂ්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### a) JICA ස්වේච්ඡා සේවකයින් සැපයීම (JICA Volunteers)

අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් JICA ආයතනය මඟින් රජයේ විශ්ව විද්‍යාල සඳහා ස්වේච්ඡාවෙන් ජපන් භාෂාව ඉගැන්වීමට ගුරුවරුන් සම්බන්ධ කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

### b) සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම අනුව NUS (National University of Singapore) ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම අනුව NUS (National University of Singapore) ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භ කරනු ලැබීය. ඒ අනුව, සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවන ලදි. අපේක්ෂකයින් ප්‍රධාන වශයෙන් තෝරා ගනු ලබන්නේ අධ්‍යයන කුසලතාව, පර්යේෂණ, භාෂා ප්‍රවීණතාවය සහ සම්මුඛ පරීක්ෂණ කාර්ය සාධනය මත පදනම්ව ය. ඉහත සුදුසුකම් සපුරන ලද ඉහළම ලකුණු ලබාගත් අයදුම් කරුවන් හතළිස් එක්දෙනෙකුගේ (41) නාමයෝජනා අවසන් තෝරා ගැනීම් සඳහා සිංගප්පූරු පාර්ශවය වෙත යොමු කර ඇත.

### c) අ.පො.ස. උසස් පෙළ විභාගය ඉහළින් සමත් වූ සිසුන් හට සිය ප්‍රථම උපාධිය ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය විශ්වවිද්‍යාලවල හැදෑරීම සඳහා අවස්ථාව සළසා දීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන

ජාත්‍යන්තරව ශ්‍රේණිගත කරන ලද විදේශීය විශ්වවිද්‍යාලවල සිය ප්‍රථම උපාධි හැදෑරීමට අ.පො.ස. උසස් පෙළ ඉහළින් සමත් සිසුන් හට සහය වීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මෙම ශිෂ්‍යත්ව වැඩසටහනක ක්‍රියාත්මක කරනු ලැබේ.

උසස් හා ගෝලීය වශයෙන් තරඟකාරී මානව සම්පතක් සංවර්ධනය කිරීමේ ජාතික ප්‍රතිපත්ති ඉලක්කයට අනුකූලව, මෙම අවස්ථා ලබා දීම සඳහා 2025 අයවැය යටතේ රුපියල් මිලියන 200 ක් වෙන් කර ඇත. 2024 දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීය.

වසර පහක් ඇතුළත (2025–2029), ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව 200 ක් ප්‍රදානය කිරීමට අපේක්ෂිත අතර, 2025 දී සිසුන් 32 දෙනෙකු තෝරා ගනු ලැබීය. අපේක්ෂකයින් ප්‍රධාන වශයෙන් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන උසස් පෙළ විෂය ධාරාවන්හි ඉහළම ඉසෙඩ් ලකුණු අනුපිළිවෙල මත ය. අධ්‍යයන කුසලතාවට අමතරව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් භාවිතා කරන තේරීම් ක්‍රමවේදය කෙරෙහි ද අවධානය යොමු කරනු ලබන අතර, එමඟින් (සමස්ත ලංකා සහ දිස්ත්‍රික් කුසලතා නිර්ණායක හරහා) සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම අපේක්ෂා කෙරේ.

ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් සංරචක ඇතුළත් වන අතර, උපරිම වසර හතරක කාලයක් සඳහා අදාළ වේ:

I. පාඨමාලා ගාස්තු සහ අනෙකුත් අධ්‍යයන ගාස්තු
II. ආහාර සහ නවාතැන් වියදම් සඳහා මාසික දීමනාව
III. සෞඛ්‍ය රක්ෂණය සඳහා වන දායකත්වය
IV. ළඟම ඇති ගුවන් තොටුපළේ සිට සත්කාරක විශ්ව විද්‍යාලයට අභ්‍යන්තර ප්‍රවාහනය ඇතුළුව එක් වරක් පමණක් ගෙවනු ලබන පිරිමැසුම් පන්තියේ වට-සංචාර (round trip) ගුවන් ගමන් ගාස්තු

වසරක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානයේ සමස්ත වටිනාකම රු. රුපියල් මිලියන විස්සක් (20,000,000) උපරිමයකට සහ වසර හතරක මුළු කාලය සඳහා රු. රුපියල් මිලියන අසූවක් (80,000,000) උපරිම සීමාවකට යටත් වේ.

පහත ලැයිස්තුගත කර ඇති ගෝලීය විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ඉහළම 500 තුළ වූ විශ්වවිද්‍යාලයකට සිසුන් ඇතුළත් විය යුතු අතර එම විශ්වවිද්‍යාලයේ උපදෙස් මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව විය යුතුය.

- QS ලෝක විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම්
- ටයිම්ස් උසස් අධ්‍යාපන (THE) ලෝක විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම්
- ලෝක විශ්ව විද්‍යාල (ARWU) අධ්‍යයන ශ්‍රේණිගත කිරීම - ෂැංහයි ශ්‍රේණිගත කිරීම්

ශිෂ්‍යත්වලාභීන් තම අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු නැවත ශ්‍රී ලංකාවට පැමිණ රටේ ආර්ථික හා තිරසාර සංවර්ධනයට දායක විය යුතුය. ශිෂ්‍යත්ව ලාභීන්ගේ කාර්ය සාධන අධීක්ෂණය අදාල විශ්වවිද්‍යාල සහ එම රටවල පිහිටි විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් සිදු කෙරේ.

### d) Huwawei's Seeds for the Future 2024 වැඩ සටහන

Huawei Technologies Lanka Company (Pvt.) Ltd විසින් 2016 වසරේ සිට "Seeds for Future" වැඩසටහන දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා ගෝලීය CSR ප්‍රමුඛ වැඩසටහන ලෙස දියත් කරන ලද අතර මෙමගින් සන්නිවේදන අංශය කෙරෙහි වැඩි අවබෝධයක් සහ උනන්දුවක් ගොඩනැගීම සහ සහභාගීත්වය වැඩිදියුණු කරනු ලබයි. ඒ යටතේ ශ්‍රී ලාංකික රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂිත සිසුන් සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.

2025 වර්ෂය සඳහා Huawei Technologies Lanka Company (Pvt.) Ltd විසින් උක්ත ශිෂ්‍යත්ව වැඩ සටහනට සහභාගී වීම සඳහා ශ්‍රී ලාංකික උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍යත්ව 06 හයක් පිරිනමා තිබුණි. තෝරාගත් අපේක්ෂකයින් 2025 අගෝස්තු 16 සිට 2025 අගෝස්තු 26 දක්වා චීනය වෙත සංචාරය කරන ලද අතර මෙම වැඩසටහන සිසුන්ට තාක්‍ෂණ ක්ෂේත්‍රයේ අත්දැකීම් සහ චීන සංස්කෘතිය සම්බන්ධයෙන් හැදෑරීමට වටිනා අවස්ථාවක් විය.

**වීසා (Visa) පහසුකම් ලබා දීම**

සියළු විශ්වවිද්‍යාල වල විසින් අධ්‍යයන හා ඉගැන්වීම් කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශ සිසුන් සහ විදේශ ආචාර්යවරුන් සඳහා ඇතුළත්වීමේ වීසා (Entry Visa) සහ මෙරටට පැමිණීමෙන් පසුව අදාළ කාලසීමාවට අනුව නේවාසික වීසා (Residence Visa) ලබාදීම හා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ සෘජුවම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පහසු කරවනු පිණිස නව වීසා මාර්ගෝපදේශයක් 2025/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇත.

## 4. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීම

### 4.1 ටෝකියෝ සම්මුතිය අපරානුමත (Ratify) කිරීම

1970 දශකයේ සිට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ගෝලීය සංචලනය වැඩිවීමත් සමඟ, යුනෙස්කෝ සංවිධානය විසින් කලාපීය සම්මුතීන් හයක් සම්මත කර, ක්‍රියාත්මක කර ඇත. අධ්‍යාපනයේ ගෝලීයකරණය සැලකිල්ලට ගනිමින් විවිධ රටවල අධ්‍යාපන සුදුසුකම් සමානව සහ සාධාරණව හඳුනා ගැනීමේ වැදගත්කම පිළිබඳව මෙම සම්මුතීන් හරහා අවධානය යොමු කර ඇත. 2022 වර්ෂය වන විට ලෝකයේ රටවල් 122ක් මෙම උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් වන කලාපීය සම්මුතීන් එකක් හෝ කිහිපයක් අපරානුමත කර ඇති අතර ඒ හරහා එම රටවලට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂී අවස්ථාවන් රැසක් හිමි වී ඇත.
ඒ අතරින් 1983 බැංකොක් සම්මුතිය යාවත්කාලීන කරමින් 2011 වසරේදී සම්මත කරනු ලැබූ ටෝකියෝ සම්මුතිය, ශ්‍රී ලංකාවට අදාළ කලාපීය සම්මුතියයි. එය උසස් අධ්‍යාපනයේ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ආසියා - පැසිෆික් කලාපීය සම්මුතිය ලෙසද හඳුන්වයි.

ශ්‍රී ලංකාව ආසියාවේ අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමටත්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ගෝලීය අධ්‍යාපන ක්ෂේත්‍රයට විවෘත කරගැනීමටත්, ලොව පුරා රැකියා වෙළඳපොලවල් සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රම බලකාය යොමු කිරීමටත් සහාය වන මෙම උසස් අධ්‍යාපනයේ

සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ටෝකියෝ සම්මුතිය අපරානුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඒ අනුව, උසස් අධ්‍යාපනයේ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ ටෝකියෝ සම්මුතිය අපරානුමත (Ratify) කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය හා ගරු නීතිපතිතුමා ගේ නිරීක්ෂණ මේ වන විට හිමිව ඇත.

## 4.2 Erasmus+ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන

යුරෝපා සංගමය සහ ලොව පුරා රටවල් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමට දිගු කාලීනව කටයුතු කරන ERASMAS+ යනු අධ්‍යාපනය, පුහුණුව, යෞවනය සහ ක්‍රීඩා සඳහා උපකාර කිරීම සඳහා වන යුරෝපා කොමිසම විසින් මෙහෙයවනු ලබන වැඩසටහනකි. එම වැඩසටහනට සම්බන්ධවීම මඟින් ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන වලට තම සිසුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරු කිරීම්, ධාරිතා සංවර්ධනය කිරීම්,ඒකාබද්ධ උපාධි අධ්‍යයන වැඩසටහන් වැනි ජාත්‍යන්තරීකරණය ඉහල නංවන වැඩසටහන් සඳහා ප්‍රදානයන් ලබා ගත හැකි වේ.

Erasmus+ වැඩසටහන සමඟ ශ්‍රී ලංකාවේ ශක්තිමත් සම්බන්ධතාවය පිළිබිඹු කරමින් කලාපීය Erasmus+ රැස්වීම සහ සම්බන්ධතා ඇති කර ගැනීමේ සම්මන්ත්‍රණය (Regional Erasmus+ Cluster Meeting and Contact-Making Seminar 2025 from 18th to 20th November 2025) පැවැත්වීම සඳහා යුරෝපීය කොමිසම විසින් ශ්‍රී ලංකාව තෝරා ගනු ලැබුණු අතර එය ඉතාමත් සාර්ථක අන්දමින් 2025 නොවැම්බර් 18 සිට 20 දක්වා කොළඹ ගාලු මුවදොර හෝටලයේදී පවත්වන ලදි. මෙම වැඩ සටහන සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන් 140 කට ආසන්න සංඛ්‍යාවක සහභාගී විය. එමඟින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට, විදේශීය උසස් අධ්‍යාපන ආයතන සමඟ සිය සහයෝගීතාව ශක්තිමත් කිරීමට සහ අනාගත Erasmus+ හවුල්කාරිත්වයන් සහ අරමුදල් අවස්ථා ගවේෂණය කිරීමට වටිනා වේදිකාවක් ලබා දෙන ලදි. මෙහිදී විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර සහ දේශීය හවුල්කරුවන් සමඟ ජාලගත කිරීමත් Erasmus+ වැඩසටහන පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමත් අරමුණු කරගනිමින් 2025 නොවැම්බර් 19 වන දින අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික Erasmus+ තොරතුරු සැසියක් (National Erasmus+ Information Session) ප්‍රධාන සම්මන්ත්‍රණයට සමගාමීව සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, ශාස්ත්‍රඥයින්, මණ්ඩපාධිපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන් ඇතුළු රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල වලින් විද්වතුන් 175 කට අධික පිරිසක් සහභාගී විය.

## 4.3 ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අධ්‍යාපනික සහයෝගීතාවය අරමුණු කර ගනිමින් අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් වලට එළැඹීම

මේ යටතේ,පසුගිය වර්ෂය තුල පහත සඳහන් ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

I. අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල විධායක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා චීන මහජන සමූහාණ්ඩුවේ වූහාන් ක්‍රීඩා විශ්වවිද්‍යාලය (The Wuhan Sports University, The People’s Republic of China) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

II. ඒකාබද්ධ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ ජාතික හෝ ජාත්‍යන්තර ව්‍යාපෘති සඳහා අයදුම් කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ සහයෝගීතාවය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා ජපානයේ අයිසු විශ්වවිද්‍යාලය (The University of Aizu, Japan) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

III. ඒකාබද්ධ පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ශිෂ්‍ය හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන්, ඒකාබද්ධ වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම, ප්‍රකාශන හුවමාරු කර ගැනීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා නෝර්වේ ඇග්ඩර් විශ්වවිද්‍යාලය (The University of Agder, Norway) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

IV. අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සැලසෙන කෙටි කාලීන පුහුණු පාඨමාලා හා ව්‍යාපෘති හඳුනා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලය (The Deakin University of Australia) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම.

V. විශේෂ කෙටි කාලීන අධ්‍යයන වැඩසටහන් සහ ව්‍යාපෘති පැවැත්වීම හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරු කිරීම ආදිය වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ, මොරටුව විශ්වවිද්‍යාලය හා චීනයේ ලින්යි විශ්වවිද්‍යාලය (The Linyi University of the People’s Republic of China ) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

VI. පර්යේෂණ සහ අධ්‍යාපනික වැඩසටහන් වලට අදාළ ඉගැන්වීම්, ඉගෙනුම් ද්‍රව්‍ය සහ අනෙකුත් අදාළ සාහිත්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම, අන්‍යෝන්‍ය උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්හි කෙටි කාලීන අඛණ්ඩ අධ්‍යාපනික වැඩසටහන්, සම්මන්ත්‍රණ හෝ වැඩමුළු ඒකාබද්ධව සංවිධානය කිරීම, අරමුදල් සපයන ආයතන විසින් අනුග්‍රහය දක්වන පර්යේෂණ හෝ පුහුණු වැඩසටහන් ඒකාබද්ධව යෝජනා කිරීම හා ඒවායේ නිරත වීම, අධ්‍යාපනය සහ/හෝ පර්යේෂණ සඳහා සීමිත කාල සීමාවන් සඳහා අන්‍යෝන්‍ය පදනමක් මත සිසුන් හුවමාරු කර ගැනීම ආදී වූ වැඩසටහන් පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ඉන්දියාවේ මහත්මා ගාන්ධි වෛද්‍ය විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය (Mahatma Gandhi University of Medical Sciences and Technology-MGUMST) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

VII. විශ්වවිද්‍යාලය තුල ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම හා විශ්ව විද්‍යාලය තුල සිදු කෙරෙන අධ්‍යාපන කටයුතු වල සංවර්ධනය සඳහා අවශ්‍ය වන ඉගැන්වීම් උපකාරක, පෙළපොත් වැනි සම්පත් හුවමාරු කරගැනීම ආදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ, අග්නිදිග විශ්වවිද්‍යාලය හා චීන සමූහාණ්ඩුවේ ෂැන්ඩොන්ග් විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය විශ්වවිද්‍යාලය (Shandong University of Science and Technology, China) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

VIII. පර්යේෂණ සහයෝගීතා වැඩසටහන්, පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්, විදේශයන්හි අධ්‍යයන අවස්ථා, සායනික අත්දැකීම්, උපදේශාත්මක සහ සංස්කෘතික වැඩසටහන් ආදිය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ, කැලණිය විශ්වවිද්‍යාල හා ඇමරිකා එක්සත් ජනපදයේ Cortland හි නිව්යෝර්ක් රාජ්‍ය විශ්ව විද්‍යාලය(State University of New York College at Cortland, United States of America) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

IX. උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා වැඩසටහන් සම්බන්ධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම අරමුණු කර ගනිමින් ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය (Royal Melbourne Institute of Technology සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

X. විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික සහයෝගීතාවය ඇතිකර ගැනීම සඳහා, දෙපාර්ශවයේ අන්‍යෝන්‍ය එකඟතාව මත හඳුනාගනු ලැබූ විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් ඒකාබද්ධ පර්යේෂණ සිදු කිරීම, දෙපාර්ශවයේ අධ්‍යයන කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය හුවමාරුව, ප්‍රකාශන, පෙළ පොත් හා විද්‍යාත්මක ලේඛන ආදිය හුවමාරුව, අධ්‍යයන කාර්ය මණ්ඩලවල අත්දැකීම් හුවමාරුව, විද්‍යාත්මක හා සංස්කෘතික වැඩසටහන් සංවිධානය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලය හා බෙලරුස් ජනරජයේ පොලස්කි රාජ්‍ය විශ්වවිද්‍යාලය (The Polessky state University, Republic of Belarus) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XI. දෙරටේ විශ්වවිද්‍යාල දෙක අතර සහයෝගීතාව පෝෂණය කිරීම හා වඩා වර්ධනය කර ගැනීම, විශ්වවිද්‍යාල දෙකෙහි පීඨ සහ සිසුන් අතර අධ්‍යාපනික, වෘත්තීය සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම, විද්වත් සහයෝගීතාව ඇතිකර ගැනීම, සංස්කෘතික අන්තර්ක්‍රියා සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලය හා සහ රුසියානු සමූහාණ්ඩුවේ ව්ලැඩිමීර් රාජ්‍ය විශ්වවිද්‍යාලය ( The Vladimir State University of the Russian Federation) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XII. විශේෂඥයින්, විද්වතුන්, අධ්‍යයන කාර්ය මණ්ඩල හා සිසුන් හුවමාරු කර ගැනීම උපාධිධාරීන් සම සුපරීක්ෂණය, ඒකාබද්ධ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම, තොරතුරු, ලේඛන සහ විද්‍යාත්මක ප්‍රකාශන

හුවමාරු කර ගැනීම, පුහුණු වැඩසටහන් සහ ප්‍රජා සේවයේ අත්දැකීම් හුවමාරු කර ගැනීම, සම්මන්ත්‍රණ, සමුළු සහ විද්‍යාත්මක රැස්වීම් පැවැත්වීම, පුහුණු වැඩසටහන් සංවර්ධනය හා ශිෂ්‍යත්ව වැඩසටහන් පිළිබඳව සිසුන් දැනුවත් කිරීම ආදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ බහු අවයවික විද්‍යා අධ්‍යනාංශය හා තායිලන්තයේ චුලාලොන්කෝන් විශ්වවිද්‍යාලයේ ඛනිජ තෙල් සහ ඛනිජ රසායනික විද්‍යාලය, (The Petroleum and Petrochemical College, The Chulalongkorn University, Kingdom of Thailand) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XIII. භූ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානයේ සහයෝගීතාවය මත, අන්‍යෝන්‍ය එකඟතාවය සහිත ක්ෂේත්‍රයන්හි අධ්‍යයන හා පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම මූලික කර ගනිමින් ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා මහජන චීන සමූහාණ්ඩුවේ, චීන විද්‍යා ඇකඩමිය යටතේ පවතින භූ විද්‍යා හා භූ භෞතික විද්‍යා ආයතනය (The Institute of Geology and Geophysics) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම. අපේක්ෂිතය. මේ තුළින් දෙරටේ අරමුදල් සපයන ආයතන වලින් පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීම සඳහා ඒකාබද්ධ අයදුම්පත් ඉදිරිපත් කිරීම, ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීම, විද්‍යාඥයින් හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය අරමුණු කෙරේ.

XIV. අන්තර්ජාතික ශාස්ත්‍රීය සහයෝගීතාවය, සංස්කෘතික අන්තර්ක්‍රියා හා මිත්‍රත්වය, ශිෂ්‍ය හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරුව, ඒකාබද්ධ පර්යේෂණ, සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදිය සංවිධානය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය හා ඉන්දියාවේ භාරතීදාසන් විශ්වවිද්‍යාලය (Bharathidasan University) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XV. අධ්‍යාපන හා අධ්‍යයන පර්යේෂණ ක්ෂේත්‍රවල සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල දෙක අතර සිසුන්, අනධ්‍යන කාර්ය මණ්ඩලය, පශ්චාත් උපාධි සිසුන් සහ පීඨ සාමාජිකයින් හුවමාරුව සහ සංචාර දිරිමත් කිරීම, ටයිෆූන් විද්‍යා( typhoon sciences) ක්ෂේත්‍රයට අදාළ තොරතුරු හා ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා සහ ඒකාබද්ධ පර්යේෂණ, සම්මන්ත්‍රණ හා අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලය සහ ජපානයේ යොකොහමා ජාතික විශ්වවිද්‍යාලයේ බහුවිධ විද්‍යා ආයතනය ( Institute for Multidisciplinary Sciences, Yokohama National University of Japan ) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XVI. ශිෂ්‍ය හා අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරුව, අධ්‍යයන ප්‍රකාශන හා තොරතුරු හුවමාරුව, ඒකාබද්ධ පර්යේෂණ හා සම්මන්ත්‍රණ පැවැත්වීම හා ජපන් සහ ඉංග්‍රීසි භාෂා පුහුණුව ලබාදීම ආදිය අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලය සහ ජපානයේ ටොකුයමා විද්‍යාලයේ, ජාතික තාක්ෂණ ආයතනය (National Institute of Technology, Tokuyama College (NITTC), Japan) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XVII. ආහාර සුරක්ෂිතතාවය හා මහජන සෞඛ්‍යය කෙරෙහි පවතින අභියෝග හා ඒවාට විසඳුම් සොයනු පිණිස, දේශගුණික විපර්යාස හා පරිසර දූෂණය පිළිබඳ ජාත්‍යන්තර ජල සමුළුව පැවැත්වීමට අදාළව තීරයක් සහ මාවතක් සඳහා වන ජාතික හා ජාත්‍යන්තර විද්‍යා සංවිධාන සන්ධානය (Alliance of National and International Science Organizations for the Belt and Road Regions – ANSO) සහ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර ව්‍යාපෘති ගිවිසුමකට එළැඹීම. මෙම ගිවිසුමට අත්සන් තැබීම තුළින් කලාපීයව මුහුණ පෑමට සිදුවන පාරිසරික හා මහජන සෞඛ්‍යමය ගැටළු වලට පිළිතුරු සෙවීමට හා ජාත්‍යන්තර සහයෝගීතාව වැඩිදියුණු කරමින් තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමටද දායකත්වය සැපයේ.

XVIII. මනුෂ්‍ය හා සත්ත්ව ප්‍රජාව තුළත්, පරිසරයේත් MRSA රෝගය (Methicillin Resistant Staphylococcus Aureus) සම්ප්‍රේෂණය වීම පිළිබඳවත්, ඒවායේ ක්ෂුද්‍රජීවී නාශක හා ජෛව නාශක ප්‍රතිරෝධය පැහැදිලි කිරීම සඳහාත්, ජානමය විවිධත්වය අධ්‍යයනය කිරීමත් යනාදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ චීනයේ හොංකොං චීන විශ්වවිද්‍යාලය (The Chinese University of Hong Kong of the People's Republic of China) අතර පර්යේෂණ සහයෝගිතා ගිවිසුමකට (Research Collaboration Agreement) සහ ද්‍රව්‍ය හුවමාරු ගිවිසුමකට (Material Transfer Agreement) එළැඹීම.

XIX. අධ්‍යයන සහයෝගීතාව ඉහළ නැංවීම, පීඨ සහ සිසුන් අතර අධ්‍යාපන, වෘත්තීය හා සංස්කෘතික ක්‍රියාකාරකම් තුළින් මිත්‍රත්වය ඉහළ නැංවීමත්, ඒකාබද්ධ පර්යේෂණ, සම්මන්ත්‍රණ/ වැඩමුළු පැවැත්වීම ආදිය

අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සහ ජපානයේ - කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය ( Kyoto College of Graduate Studies for Informatics – KCGI ) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XX. අන්‍යෝන්‍ය එකඟතාවය සහිත ක්ෂේත්‍රවල අධ්‍යයන හා පර්යේෂණ සහයෝගීතාවය ඇතිකර ගැනීමටත්, අධ්‍යයන තොරතුරු සහ ද්‍රව්‍ය හුවමාරු කරගැනීමටත්, සිසුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල හුවමාරුවත්, ඒකාබද්ධ සම්මන්ත්‍රණ/ වැඩමුළු සඳහා අනුග්‍රහය ලබාදීමත් ආදී කරුණු මූලික කර ගනිමින් ශ්‍රී ලංකාවේ වවුනියා විශ්වවිද්‍යාලය සහ මැඩ්‍රාස් ඉන්දියානු තාක්ෂණ ආයතනය (Indian Institute of Technology Madras) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XXI. ඉන්දියානු සංස්කෘතික සබඳතා කවුන්සිලයේ දායකත්වයෙන් (Indian Council for Cultural Relations -ICCR) ආරාධිත මහාචාර්යවරුන්ගේ සේවය කොන්ත්‍රාත් පදනම මත වවුනියා විශ්වවිද්‍යාලය වෙත ලබාගැනීම සඳහා ඉන්දියානු සංස්කෘතික සබඳතා කවුන්සිලය සහ ශ්‍රී ලංකාවේ වවුනියා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XXII. උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කැලණිය විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය (National Korea Maritime and Ocean University) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම.

XXIII. උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය (National Korea Maritime and Ocean University) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම.

XXIV. උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ යාපනය විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ බර්මින්හැම් විශ්වවිද්‍යාලය (The University of Birmingham), එඩින්බර්ග් විශ්වවිද්‍යාලය (The University of Edinburgh) සහ ලෙස්ටර් විශ්වවිද්‍යාලය (The University of Leicester) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XXV. අධ්‍යාපනික සහයෝගීතාව ඉහළ නැංවීම, පීඨ සහ සිසුන් අතර අධ්‍යාපන, හා සංස්කෘතික ක්‍රියාකාරකම් ඉහළ නැංවීම, සහයෝගිතා පර්යේෂණ, ශාස්ත්‍රීය වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම ආදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා තායිලන්තයේ මහාමකුට් බෞද්ධ විශ්වවිද්‍යාලය (Mahamakut Buddhist University, Thailand) අතර ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාවය ගොඩනැගීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XXVI. අධ්‍යාපන, පර්යේෂණ හා ප්‍රජා සේවය යන ක්ෂේත්‍ර තුළින් අධ්‍යාපනික සහයෝගීතාවය ඉහළ නැංවීම, අධ්‍යාපන විශේෂඥයින්ගේ හා කථිකාචාර්යවරුන්ගේ විශේෂඥ දැනුම ලබා ගැනීම, විද්‍යාගාර හා පුස්තකාල ආදී භෞතික සම්පත් උපයෝජනය, සීමාවාසික පුහුණුව ඇතුළු පුහුණු වැඩසටහන් හා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ ආදිය මගින් මානව සම්පත් සංවර්ධනය, විෂයමාලා සංවර්ධනය යනාදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ඉන්දුනීසියාවේ ජකර්තාහි නාලන්දා ආයතනය (Nalanda Institute, Jakarta, Indonesia) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

XXVII. අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රවල ඒකාබද්ධ පර්යේෂණ සිදු කිරීමට හා ප්‍රකාශන එළි දැක්වීමටත්, ඒකාබද්ධ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමටත්, අධ්‍යයන කාර්යමණ්ඩල හා ශිෂ්‍ය හුවමාරුවටත්, අධ්‍යාපනික තොරතුරු හා ද්‍රව්‍ය හුවමාරුවත් යනාදිය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය සහ පෝලන්තයේ එස් ජී එච් වෝර්සෝ ආර්ථික විද්‍යා පාසල ( SGH WARSAW School of Economics, Poland) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

**4.4 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා විදේශීය රාජ්‍යයන් /විදේශීය විශ්වවිද්‍යාල අතර අධ්‍යාපනික සහයෝගීතාවය අරමුණු කර ගනිමින් අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් වලට එළැඹීම**

I. උසස් අධ්‍යාපන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඕස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (Griffith University, Australia) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

II. උසස් අධ්‍යාපන සහයෝගීතාවයන් උදෙසා සිංගප්පූරු ජනරජයේ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය (The National University of Singapore) හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

III. උසස් අධ්‍යාපන සහයෝගීතාවයන් උදෙසා හංගේරියාවේ විදේශ කටයුතු හා වෙළඳ අමාත්‍යාංශය (The Ministry of Foreign Affairs and Trade of Hungary) හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර Stipendium Hungaricum ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2025-2027 වසර සඳහා අවබෝධතා ගිවිසුමකට එළැඹීම. විශ්වවිද්‍යාලය (The University of Leicester) අතර අවබෝධතා ගිවිසුමකට එළැඹීම.

## 2.1.7. සැලසුම් අංශය

- දේශීය විදේශීය ව්‍යාපෘතිවලට අදාළව 2025 වර්ෂයේ කාර්තු හතර සඳහා ප්‍රගති වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයටත් 2025 වසරේ කාර්තු හතර සඳහා වූ ප්‍රගති වාර්තාව ව්‍යාපෘති මෙහෙයුම් හා කළමනාකරණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇත.

- දැනට ක්‍රියාත්මක වන ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය හා වයඹ සංවර්ධන ව්‍යාපෘතිය, සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ මෙහෙයුම් කටයුතු පැවැත්ව වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

- 2025 වර්ෂයේ දී විදේශීය ව්‍යාපෘතිවලට හා අයවැය යෝජනාවලට අදාළව පවත්වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

| ව්‍යාපෘතිය | රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ADB) | 03 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 0 |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP) | 03 |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය | 02 |
| රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 04 |
| රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිලිබඳ ඒකකයක් පිහිටුවීම | |
| කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය | |
| රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | |
| **එකතුව** | 12 |

*වගුව 2.33*

- 2025 වර්ෂයේ විදේශ ව්‍යාපෘති 5 සහ අයවැය යෝජනා ව්‍යාපෘති 7ක් සැලසුම් අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදි.
- අයවැය යෝජනාවලට අදාළ ව මාසික ප්‍රගති වාර්තා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ප්‍රගති සමාලෝචන වාර්තාව සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දී ඇත.
- 2025 වර්ෂයට විගණන විමසීම් 04 ක් සඳහා පිළිතුරු සපයා ඇත.
- උසස් අධ්‍යාපනය සඳහා වන උප කමිටු නියෝජනය කරමින් අවසන් වාර්තාව සකස් කිරීම සඳහා දායකත්වය ලබා දී ඇත.
- විදේශීය ප්‍රදාන යටතේ පහත දක්වා ඇති පරිදි ව්‍යාපෘති යෝජනා නිර්දේශ කර අනුමැතිය ලබා ගෙන ඇත.

| විශ්වවිද්‍යාලය | අමාත්‍යාංශය මඟින් නිර්දේශිත ව්‍යාපෘති ගණන | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත ව්‍යාපෘති ගණන | අනුමැතිය ලත් ව්‍යාපෘති ගණන | මුදල රු.මි |
|---|---|---|---|---|
| කැළණිය වි.වි. | 1 | 1 | 1 | 23.65 |
| පේරාදෙනිය වි.වි. | 1 | 1 | 1 | N/A |
| **එකතුව** | | | **2** | **23.65** |

*වගුව 2.34*

### 2.1.8. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

- **2025 වර්ෂයේ දී උපාධි පිරිනැමීමේ ආයතන ලෙස පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන**

2025 වර්ෂයේ දී පහත සඳහන් ආයතන උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගන්නා ලදි.

1. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටුවරිසම් ඇන්ඩ් හොටෙල් මැනේජ්මන්ට්
2. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්ස්ටයිල් ඇන්ඩ් ඇපරල්
3. ඇමරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

ඒ අනුව, 2025 දෙසැම්බර් 31 වන දිනට ආයතන 31ක් උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගෙන ඇත.

2025.01.01 සිට 2025.12.31 දක්වා, මෙම ආයතන විසින් පිරිනමනු ලබන නව උපාධි පාඨමාලා 16ක් පිළිගනු ලැබ ඇත. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 වන දින වන විට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනය විසින් පිරිනමනු ලබන බව පිළිගෙන ඇති මුළු උපාධි සංඛ්‍යාව 293 කි.

**උපාධි පාඨමාලා සංඛ්‍යාව**

| | ප්‍රථම උපාධිය (Basic Degrees) | පශ්චාත් ඩිප්ලෝමා (P/G Diploma) | ශාස්ත්‍රපති/ විද්‍යාපති (Master) | දර්ශනශූරි (M Phil) | දර්ශනපති (Ph D) | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 2024.12.31 දිනට පිළිගනු ලැබූ උපාධි පාඨමාලා සංඛ්‍යාව | 209 | 15 | 29 | 12 | 12 | 277 |
| 2025.01.01 සිට 2025.12.31 දින දක්වා | 15 | 00 | 01 | 00 | 00 | 16 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පිළිගනු ගැබු උපාධි පාඨමාලා සංඛ්‍යාව | | | | | | |
| **2025.12.31 දිනට පිළිගෙන ඇති උපාධි පාඨමාලා සංඛ්‍යාව** | 224 | 15 | 30 | 12 | 12 | 293 |

*වගුව 2.35*

## 1. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම.

උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගැනෙන ආයතනවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ අරමුණින්, මෙම අංශය මඟින් එම ආයතනවල උපාධි පාඨමාලා සහ සිසුන් බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලබයි. එම තොරතුරු යාවත්කාලීන කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ. 2025 වර්ෂයේ විස්තර මේ සමඟ අමුණා ඇත.

**<u>2025 වසර සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය පිළිබඳ විස්තර</u>**

| | උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය | *2025 වර්ෂය* | | |
|---|---|---|---|---|
| | | මුළු ශිෂ්‍ය ලියාපදිංචිය 2025 | ඇතුළත් කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 2025 වර්ෂයේ උපාධිය ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව |
| 01 | මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය (ISM) | 11 | 33 | 0 |
| 02 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) | 5898 | 19745 | 3270 |
| 03 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 0 | 48 | 133 |
| 04 | ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) | ලැබී නොමැත. | | |
| 05 | ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් (AQUINAS) | ලැබී නොමැත. | | |
| 06 | සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (SAITM) (ප්‍රයිවට්) ලිමිටඩ් | ක්‍රියාත්මක නොවේ | | |
| 07 | නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය (NSBM) | 1862 | 6550 | 1397 |
| 08 | කොලම්බු ඉන්ටනැෂනල් නොටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්- CINEC | 1594 | 3424 | 697 |
| 09 | ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA) | 434 | 1552 | 160 |
| 10 | ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (CASL) | 779 | 2050 | 315 |
| 11 | සණස කැම්පස් ලිමිටඩ් (SANASA) | 0 | 198 | 38 |
| 12 | හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (HORIZON) | 809 | 3044 | 180 |
| 13 | කේ. අයි.යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (KIU) | 4999 | 10260 | 2809 |
| 14 | නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 247 | 351 | 03 |
| 15 | ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් | 1417 | 7062 | 796 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (SLINTEC) | ලැබී නොමැත. | | |
| 17 | සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (SAEGIS) | 162 | 905 | 111 |
| 18 | ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ESOFT) | 40 | 279 | 50 |
| 19 | ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමෙස්ට්‍රි සිලෝන් ආයතනය (ICHEM) | 292 | 292 | 0 |
| 20 | ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ්( ICBT) | ලැබී නොමැත. | | |
| 21 | බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (BCI) | 87 | 427 | 48 |
| 22 | රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (RIC) | 0 | 11 | 0 |
| 23 | බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් (BMS) | ලැබී නොමැත. | | |
| 24 | ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පීවීටී) එල්ටීඩී | ලැබී නොමැත. | | |
| 25 | **ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිටියුට්** (ප්‍රයිවට්) ලිමිටඩ් | 43 | 249 | 0 |
| 26 | **ගේට්වේ කොලේජ්** (ප්‍රයිවට්) ලිමිටඩ් | 11 | 22 | 0 |
| 27 | **ලයිසියම් කැම්පස්** (ප්‍රයිවට්) ලිමිටඩ් | 26 | 19 | 0 |
| 28 | **බ්‍රිටිෂ් ස්කූල් ඔෆ් කොමර්ස්** (ප්‍රයිවට්) ලිමිටඩ් | ලැබී නොමැත. | | |
| 29 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටුවරිසම් ඇන්ඩ් හොටෙල් මැනේජ්මන්ට් | අලුතින් පිළිගත් ආයතනයකි. | | |
| 30 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්ස්ටයිල් ඇන්ඩ් ඇපරල් | 14 | 14 | 0 |
| 31 | ඇමරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | අලුතින් පිළිගත් ආයතනයකි. | | |
| | **එකතුව** | **11889** | **34396** | **6387** |

*වගුව 2.36*

*මූලාශ්‍රය: අදාළ ආයතන විසින් සපයන ලද තොරතුරු*

## 2. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනයේ තත්ත්ව සහතික කිරීමේ සහ ප්‍රතීතන ක්‍රියා පටිපාටියේ ප්‍රගතිය

### සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP)

උපාධි ප්‍රදානය කරන ආයතන පිළිගැනීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) සකස් කිරීමේ අවශ්‍යතාවය ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව (SCAQA) අවධාරණය කරන ලදී. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පිළිගැනීමේ ක්‍රියා පටිපාටිය සහ නිර්ණායක ස්ථාපිත කිරීම සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියේ (SOP) අරමුණයි.

2007 අංක 7 දරන සමාගම් පනත, ආයෝජන මණ්ඩල නීතිය හෝ දේශීය උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය අපේක්ෂා කරන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතන යටතේ ලියාපදිංචි කර ඇති සියලුම උසස් අධ්‍යාපන ආයතන සඳහා මෙම විෂය පථය අදාළ වේ.

## 3. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් සිදු කරනු ලබන නව ප්‍රගමනයන් අන්තර්ජාතික අධ්‍යාපන (Trans National Education (TNE) ප්‍රතිපත්තිය

ජාත්‍යන්තරකරණ උපාය මාර්ගයක් ලෙස, වර්තමාන සන්දර්භය තුළ අන්තර්ජාතික අධ්‍යාපනය (TNE) වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අන්තර්ජාතික උසස් අධ්‍යාපනය යනු මව් ආයතනයක් විසින් සෘජුව හෝ

ජාත්‍යන්තර හවුල්කරුවෙකු සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන් විදේශයන්හි ලබා දීම ලෙස අර්ථ දැක්වේ. පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාව TNE සැපයුම්කරුවන්ගේ වේගවත් ව්‍යාප්තියක් දැක තිබේ. මෙම සැපයුම්කරුවන් අතරින්, බොහෝ දෙනෙක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යාපාර ලෙස (සමාගම් රෙජිස්ට්‍රාර් හෝ ආයෝජන මණ්ඩලය සමඟ) ලියාපදිංචි වී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කිරීම හෝ නියාමනය කිරීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් නොමැත.

ඒ අනුව, අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් පහත සඳහන් අරමුණු පෙරදැරිව TNE අංශය සඳහා ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත;

අ. ආර්ථික වර්ධනයට හේතු වන ප්‍රධාන අංශවල රැකියා හැකියාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට උසස් තත්ත්වයේ උසස් අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය ක්‍රමානුකූලව පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම.

ආ. රජය විසින් හඳුනාගත් ක්ෂේත්‍රවල වර්ධනය සඳහා අවශ්‍ය කුසලතා ඇති මිනිස් බලය සැපයීම මගින් තිරසාර සංවර්ධනයට සහ ආර්ථික වර්ධනයට සහාය වීම.

ඇ. උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපන අරමුණු වෙනුවෙන් විදේශගත වන සිසුන් සංඛ්‍යාව අඩු කිරීම සහ එමඟින් විදේශ විනිමය වැය කිරීම අඩු කිරීම.

ඇ. ශ්‍රී ලාංකික නොවන අයට සේවය සපයන සහ රටට සැලකිය යුතු ආදායමක් උපයන උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ඉස්මතු වීමට හැකි වන පරිදි හොඳින් සැලසුම් කරන ලද උපාය මාර්ගයකට අඩිතාලම දැමීම.

## 4. කාලානුරූපී ආයතනික සමාලෝචනය/කාලානුරූපී වැඩසටහන් සමාලෝචනය

මෙම විධිවිධාන යටතේ පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සහ උපාධිවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා, 2014.07.28 දින පැවති 15වන ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීමේ ස්ථාවර කමිටු (SCAQA) තීරණයට අනුව, අදාළ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් වසර පහක් (05) සම්පූර්ණ කරන සියලුම ආයතන සහ උපාධි වැඩසටහන් සඳහා සමාලෝචනයක් පැවැත්වීමට තීරණය කර ඇත.

වර්තමානයේ, ආයතන 31ක් උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගෙන ඇති අතර, මෙම ආයතන මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා 293ක් පිළිගෙන ඇත. 2025.12.31 දින වන විට, ආයතන 20ක් සහ උපාධි පාඨමාලා 155ක් මූලික පිළිගැනීමෙන් වසර 5ක් සම්පූර්ණ කර ඇති අතර, ඒ අනුව පස් අවුරුදු සමාලෝචනයට යටත් විය.

## 5. ශිෂ්‍ය සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් පවත්වනු ලබන උපාධි ප්‍රදානය කරන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල (DANSHEIs) සිසුන් සඳහා සමීක්ෂණය.

උපාධි ප්‍රදානය කරන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල (DANSHEIs) සිසුන්ට ප්‍රශස්ත ඉගෙනුම් අවස්ථා ලබා දීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ අධීක්ෂණ ඒකකය විසින් මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ.

## 6. ප්‍රතීතන සහ තත්ත්ව සහතිකය පිළිබඳ ස්ථාවර කමිටුවේ (SCAQA) නිරීක්ෂණ චාරිකා

ප්‍රතීතන සහ තත්ත්ව සහතිකකරණය පිළිබඳ ස්ථාවර කමිටුවේ (SCAQA) සාමාජිකයෝ අමාත්‍යාංශ නිලධාරීන් සමඟ විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය ප්‍රකාරව පිළිගනු ලැබූ උපාධි ප්‍රදානය කරන ආයතන වෙත නිරීක්ෂණ චාරිකාවක් සිදු කළහ.

මෙම චාරිකාවේ අරමුණ වූයේ උපාධි ප්‍රදානය කරන ආයතන විසින් සපයනු ලබන පහසුකම් පරීක්ෂා කිරීමට අවස්ථාවක් SCAQA සාමාජිකයින්ට ලබා දීමයි.

**7. කාලානුරූපී වැඩසටහන් සමාලෝචකයින් සඳහා වැඩමුළුවක් පැවැත්වීම**

මාර්ගෝපදේශ පිළිබඳව පැහැදිලි කිරීම සහ දැනුවත් කිරීම සඳහා චාරික පාඨමාලා සමාලෝචකයින් (Periodic programme reviewers) වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩමුළුව, ගරු අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් 2025.09.12 දින සෝලිස් හෝටලයේ දී (Solis Hotel) සාර්ථකව පවත්වන ලදී.

**8. උපාධි පිරිනමන ආයතන සඳහා වැඩමුළුවක් පැවැත්වීම**

උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ සිදුවී ඇති විවිධ වර්ධනයන් පිළිබඳව දැනුවත් කිරීම සහ කාලානුරූපී වැඩසටහන් සමාලෝචන (Periodic programme reviews) සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම අරමුණු කරගත් වැඩමුළුව, 2025 ඔක්තෝබර් 03 වන දින පිටකෝට්ටේ සෝලිස් හෝටලයේදී (Solis Hotel) පවත්වන ලදී. අධ්‍යාපනඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශවකරුවන් ඇතුළු ප්‍රමුඛ පෙළේ සහභාගීවන්නන් 120 ක් පමණ මෙම වැඩසටහන සඳහා එක් පොදු වේදිකාවකට එක්රැස් විය.

**9. උපාධි පිරිනමන ආයතන පිළිගැනීම සඳහා දැනට පවතින මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීම සහ දේශසීමා ඉක්මවා යන අධ්‍යාපනය (Trans National Education - TNE) නියාමනය සඳහා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.**

රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල නියාමනය කිරීම සඳහා ප්‍රබල නීති රීති සහ රෙගුලාසි මාලාවක් ස්ථාපිත කිරීමෙන් පසුව, ලොව පිළිගත් අධ්‍යාපන ආයතනවලට ශ්‍රී ලංකාව තුළ විශ්වවිද්‍යාල පිහිටුවීමට අවස්ථාව ලබා දෙනු ඇත. මෙහි අරමුණ වන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සමත් වන සෑම සිසුවෙකුටම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාවන් නිර්මාණය කිරීම සහ විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීම මගින් විදේශ විනිමය උපයා ගැනීමයි.

මේ සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටියක් (SOP) දැනට කෙටුම්පත් කරමින් පවතින අතර එය ප්‍රකාශයට පත් කිරීමේ අවසන් අදියරේ පවතී. එමෙන්ම, දේශසීමා ඉක්මවා යන අධ්‍යාපනය (Trans National Education - TNE) නියාමනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති පත්‍රිකාවක් (Policy Paper) විශේෂඥ කමිටුවක් මගින් මේ වන විට සකස් කරමින් පවතී.

**10. උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව (NCHEPD)**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ගරු අමාත්‍ය ආචාර්ය හරිනී අමරසූරිය මහත්මියගේ උපදෙස් පරිදි, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් විස්තීර්ණ ජාතික ප්‍රතිපත්තියක් මේ වන විට සකස් කරමින් පවතී. මෙම ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ, උසස් අධ්‍යාපන අංශය වඩාත් අන්තර්ග්‍රහණය වූ (Inclusive), අනාගතයට ගැළපෙන (Future-ready) සහ ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී ක්ෂේත්‍රයක් බවට පරිවර්තනය කිරීමයි.

වත්මන් ප්‍රතිපත්තිමය මූලාරම්භය, රටේ උසස් අධ්‍යාපන පද්ධතිය මෙම පුළුල් ජාතික දැක්ම සමඟ සමපාත කිරීම අපේක්ෂා කරයි. රජයේ අධ්‍යාපන උපායමාර්ගයෙහි දක්වා ඇති පරිදි, මෙයට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය නවීකරණය කිරීම, පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම, වෘත්තීය සහ දුරස්ථ අධ්‍යාපනය හරහා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සහ පෞද්ගලික ආයතන සඳහා ශක්තිමත් නියාමන යාන්ත්‍රණයන් හඳුන්වා දීම ඇතුළත් වේ.

ඒ අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ගරු අමාත්‍යතුමියගේ එකඟතාවය ඇතිව, විද්වතුන්, පරිපාලකයින් සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන් නියෝජනය වන පරිදි ඉහළ පෙළේ සාමාජිකයින් 32 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. එහි සම-සභාපතිත්වය දරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපති මහාචාර්ය කපිල සෙනෙවිරත්න මහතා සහ කැළණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය විසිනි.

උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුවේ (NCHEPD) ප්‍රථම රැස්වීම, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ගරු අමාත්‍යතුමියගේ සහ කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2025.09.19 දින පවත්වන ලදී. එහිදී ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වන මාර්ග සිතියම (Road map) පිළිබඳ කෙටුම්පත් ලේඛනයක් සම-සභාපති මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද අතර, එය සාකච්ඡාව සඳහා විවෘත කරන ලදී.

උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුවේ (NCHEPD) දෙවන රැස්වීම 2025.10.02 දින පවත්වන ලදී.

ඒ අනුව, රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන අංශය, වෘත්තීය අංශය සහ උසස් අධ්‍යාපනය සඳහා අරමුදල් සැපයීම යන ක්ෂේත්‍ර පිළිබඳව කටයුතු කිරීම සඳහා අනුකමිටු හතරක් පත් කිරීමටත්, ඒ සඳහා සාමාජිකයින් වෙන් කිරීමටත් තීරණය කරන ලදී. 2025.10.22 දින පැවැත්වීමට නියමිත වැඩමුළුවේදී අදාළ පාර්ශවකරුවන්ගෙන් අවශ්‍ය තොරතුරු රැස්කිරීමේ කාර්යය මෙම අනුකමිටු වෙත පවරන ලදී.

පළමු පාර්ශවකරුවන්ගේ උපදේශන සැසිය (Stakeholder consultation session) 2025.10.22 දින පවත්වන ලදී. ඒ සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතනවල (DAIs) විද්වතුන් සහ පරිපාලකයින්, කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, දේශසීමා ඉක්මවා යන අධ්‍යාපන (TNE) සපයන්නන්, වෘත්තීය ආයතන සහ අනෙකුත් අදාළ පාර්ශවයන් නියෝජනය කරමින් 159 දෙනෙක් සහභාගී වූහ.

මෙම සැසියේ දී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) විසින් 'උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්වභාවය' පිළිබඳවත්, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) ආචාර්ය දර්ශන සමරවීර මහතා විසින් 'සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ' පිළිබඳවත් ඉදිරිපත් කිරීම් පවත්වන ලදී. ඉන් අනතුරුව, අංශ මට්ටමින් කණ්ඩායම් සාකච්ඡා පැවැත්වුණු අතර, රාජ්‍ය, රාජ්‍ය නොවන සහ වෘත්තීය උසස් අධ්‍යාපන අංශ නියෝජනය කරමින් ඉදිරිපත් කරන්නන් තිදෙනෙකු විසින් එම සාකච්ඡාවල නිගමනයන් ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව, 2025.11.10 දින උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුවේ (NCHEPD) සාමාජිකයින් සඳහා රැස්වීමක් පවත්වන ලදී. එහිදී ප්‍රතිපත්ති ලේඛනයේ කෙටුම්පත් දළ සටහනෙහි ඇතුළත් "මාර්ගෝපදේශක මූලධර්ම" (Guiding principles) නැවත සකස් කළ යුතු ආකාරය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

### 2.1.9. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය
**ලියාපදිංචි වීමේ ප්‍රගතිය**

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2015 සිට 2023 දක්වා පසුගිය වසර නවය තුළ අ.පො.ස (උ.පෙළ) සමත් සිසු සිසුවියන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට බඳවා ගන්නා ලදී.

| වර්ෂය/ ඇතුළත් කර ගත් ශිෂ්‍ය කණ්ඩායම | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | උපාධි පාඨමාලා ගණන | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අතරමග නතර වූ සිසුන් සංඛ්‍යාව | අධ්‍යාපනය හදාරමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිය ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 2017/ පළමු ශිෂ්‍ය කණ්ඩායම | 06 | 26 | 268 | 35 | 06 | 227 |
| 2018/ දෙවන ශිෂ්‍ය කණ්ඩායම | 08 | 38 | 1,281 | 89 | 175 | 1,017 |
| 2019/ තෙවන ශිෂ්‍ය කණ්ඩායම | 10 | 50 | 2,064 | 104 | 298 | 1,662 |
| 2020/ සිව්වන ශිෂ්‍ය කණ්ඩායම | 12 | 69 | 2,114 | 45 | 372 | 1,697 |
| 2021/ පස්වන ශිෂ්‍ය කණ්ඩායම | 15 | 95 | 3,665 | 92 | 1,053 | 2,520 |
| 2022/ හයවන ශිෂ්‍ය කණ්ඩායම | 16 | 101 | 4,443 | 66 | 4,377 | - |
| 2023/ හත්වන ශිෂ්‍ය කණ්ඩායම | 17 | 93 | 3,534 | - | 3,534 | |
| 2024/ අටවන ශිෂ්‍ය කණ්ඩායම | 18 | 110 | 2,866 | - | 2,866 | - |
| 2025/නවවන ශිෂ්‍ය කණ්ඩායම | 16 | 125 | 2927 | - | 2,927 | - |
| **එකතුව** | | | **23,162** | **431** | **15,608** | **7,123** |

*2.37 වගුව*

පළමු කණ්ඩායම් (Intakes) පහ යටතේ ඇතුළත් වූ සිසුන් අතරින් 7,123 දෙනෙකු සාර්ථකව තම උපාධි සම්පූර්ණ කර ඇත.

### 3. උපාධි පිරිනමන ආයතන

දැනට සිසුන් පහළොස්දහස් හයසිය අටක් (15,608) පහත සඳහන් උපාධි පිරිනමන ආයතන දහඅටෙහි (18) අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටිති;

i. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් -SLIIT
ii. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් -NSBM
iii. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය - CINEC
iv. ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි ආයතනය - SIBA
v. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය - ICASL
vi. සණස කැම්පස් ලිමිටඩ් ආයතනය - SANASA

vii. හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - HORIZON
viii. කේ. අයි.යූ. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය -KIU
ix. ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය - SLTC
x. සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - SAEGIS
xi. ඊසොෆ්ට් යුනි (ප්‍රයිවට්) ලිමිටඩ් - ESOFT
xii. ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් - AQUINAS
xiii. ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් - ICHEM
xiv. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් - ICBT
xv. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන්
xvi. රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු ලිමිටඩ් -RIC
xvii. නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (NIIBS)
xviii. බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය – BMS

**2025 වර්ෂයේ දී නවවන ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම**

2021, 2022 සහ 2023 වර්ෂයන්හි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයින්ගෙන් 9වන කණ්ඩායම (9th Intake) සඳහා අයදුම්පත් කැඳවීම 2025 ජනවාරි 22 දින සිදු කරන ලදී. ඒ සඳහා මුළු අයදුම්පත් 10,101 ක් ලැබී තිබුණි. තේරීම් සම්මුඛ පරීක්ෂණ අන්තර්ජාලය ඔස්සේ (Online) පවත්වනු ලැබිය.

තේරීම් ක්‍රියාවලියෙන් අනතුරුව, අයදුම්කරුවන් 4,454 දෙනෙකු තෝරා ගන්නා ලද අතර, ඉන් සිසුන් 2,927 දෙනෙකු උපාධි පිරිනමන ආයතන 16ක් යටතේ ලියාපදිංචි වී (Enrolled) අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

**9 වන කණ්ඩායම තෝරා ගැනීම සඳහා මාර්ගගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.**

මාර්ගගත





**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල 9වන කණ්ඩායම ලියාපදිංචි කිරීම.**




**2024 වර්ෂයේ දී 10වන කණ්ඩායම බඳවා ගැනීම**

2022, 2023 සහ 2024 වර්ෂයන්හි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත පදනම්ව, 10වන කණ්ඩායම (10th intake) බඳවා ගැනීම සඳහා වන මූලික කටයුතු 2025 වසරේදී ආරම්භ කරන ලදී. මෙම බඳවා ගැනීමේ දී නව ආයතන දෙකක් මෙම වැඩසටහනට එක් විය:

- ලයිසියම් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්)

10වන කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවීම 2025 නොවැම්බර් 01 දින මාර්ගගතව සිදු කරන ලදී. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය මුලින් 2025 නොවැම්බර් 30 ලෙස නියම කර තිබුණ ද, උසස් පෙළ විභාග කාලසටහන සහ 'දිට්වා' (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අයහපත් තත්ත්වයන් සැලකිල්ලට ගෙන එම දිනය 2025 දෙසැම්බර් 15 දක්වා දීර්ඝ කරන ලදී.

අවසාන දිනය වන විට මුළු අයදුම්පත් 15,075 ක් ලැබී තිබුණි.

**පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්**

පුවත්පත් දැන්වීම්, විශේෂාංග ලිපි, MS Teams තාක්ෂණය ඔස්සේ පවත්වන ලද අන්තර්ජාල දැනුවත් කිරීමේ සැසි, අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ව්‍යාපාර ඇතුළු මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවල එකතුවක් හරහා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නංවන ලදී.

ප්‍රධාන ක්‍රියාකාරකම්වලට පහත දෑ ඇතුළත් විය:

- දිස්ත්‍රික්ක දොළහක් (12) පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් දහඅටක් (18) පැවැත්වීම.
- කොළඹ සහ කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවැත් වූ වෘත්තීය මාර්ගෝපදේශන ප්‍රදර්ශන (Career fairs) දෙකක් (2) සඳහා සහභාගී වීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පෝස්ටර් හත්සිය පනහක් (750) බෙදා හැරීම.
- ප්‍රමුඛ පෙළේ සමාජ මාධ්‍ය ජාල ඔස්සේ විද්‍යුත් පත්‍රිකා (E-Flyers) ප්‍රචාරය කිරීම.
- YouTube ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් විකාශනය කිරීම.

- Mobitel, Hutch සහ Dialog සන්නිවේදන ජාල සමඟ සම්බන්ධ වී කෙටි පණිවුඩ මගින් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම.









ශිෂ්‍ය ණය අංශය විසින් පවත්වනු ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

1. **පවත්වන ලද ශිෂ්‍ය අධීක්ෂණ වැඩසටහන්**

ශිෂ්‍ය ණය අංශය විසින් 5, 6, 7 සහ 8වන කණ්ඩායම්වල (Intakes) සිසුන් ඉලක්ක කර ගනිමින් අන්තර්ජාලය ඔස්සේ සමීක්ෂණයක් පවත්වන ලදී. මෙහිදී එක් එක් ආයතනයට අදාළව නිරීක්ෂණ වාර්තා සකස් කර අදාළ උපාධි පිරිනමන ආයතන වෙත යොමු කරන ලදී. එමගින් අවශ්‍ය පිළියම් යෙදීමටත්, සිසුන්ගේ ගැටලු විසඳීමටත්, මෙම වැඩසටහන යටතේ ලබා දෙන අධ්‍යාපනයේ සමස්ත ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් පහසුකම් සලසන ලදී.

2. **මූල්‍ය ප්‍රගතිය**

2025 වර්ෂය සඳහා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් වෙන් කරන ලද මුළු අයවැය ප්‍රතිපාදනය රුපියල් මිලියන 2,785 කි. 2025 දෙසැම්බර් 31 දින දක්වා දරා ඇති මුළු වියදම රුපියල් මිලියන 1,947.54 කි.

2025 දෙසැම්බර් 31 දින වන විට, පහත සඳහන් ප්‍රතිලාභීන් ආවරණය වන පරිදි රුපියල් මිලියන 1,464.10 ක මුදලක් පොලී සහනාධාර (Interest subsidy) ලෙස ගෙවා ඇත:

- පාඨමාලා ගාස්තු සඳහා ණය ලබා ගන්නා සිසුන් 16,382 ක්.
- නඩත්තු දීමනා (Stipends) සඳහා ණය ලබා ගන්නා සිසුන් 13,973 ක්.

මීට අමතරව, 2024 දෙසැම්බර් 31 දින වන විට, අක්‍රීය ණය (Non-performing loans - NPLs) පියවීම සඳහා සිසුන් 427 දෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියන 337.73 ක මුදලක් ගෙවා ඇත. මෙය ණය ආපසු ගෙවීමට සුදුසුකම් ලත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 4.54% කි.

අක්‍රීය ණය ප්‍රතිශතය අවම කිරීම සඳහා ශිෂ්‍ය ණය අංශය විසින් පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. උපාධි පිරිනමන ආයතන, හවුල්කාර බැංකු සහ මහා භාණ්ඩාගාරය සමඟ නිතිපතා සාකච්ඡා පැවැත්වීම මෙන්ම උපාධිධාරීන් සඳහා ආයතන මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මීට ඇතුළත් වේ. මීට අමතරව, ණය පැහැර හරින ලද පුද්ගලයන් වෙත සිහි කැඳවීමේ විද්‍යුත් තැපැල් පණිවිඩ (Reminder emails) ද යොමු කරන ලදී.

2025 නොවැම්බර් 30 දින වන විට, ණය පැහැර හරින ලද සිසුන් සංඛ්‍යාව 359 දක්වා අඩු වී ඇති අතර, එය මුළු ණය ආපසු ගෙවන සිසුන් සංඛ්‍යාවෙන් 2.68% කි.

# 03. පරිච්ඡේදය - 2025.12.31 න් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | තත්‍ය 2024 රු. | ඒසීඒ -එෆ් |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 8,476,236,682 | 9,585,485,707 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 15,072,896 | 23,870,174 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,708,887 | 10,596,266 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **8,504,018,465** | **9,619,952,147** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **8,504,018,465** | **9,619,952,147** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 8,504,018,465 | 9,619,952,147 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 174,550,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 173,912,092 | 146,094,164 | |
| 173,044,900 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 116,352,859 | 105,503,730 | ඒසීඒ-2(ii) |
| 5,273,150,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,393,843,186 | 3,898,001,087 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 5,620,744,900 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | 4,684,108,137 | **4,149,598,981** | |
| | **මූලධන වියදම්** | | | | |
| 8,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | 10 | 5,833,290 | 119,363,100 | |
| 25,279,790,100 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 22,137,967,280 | 21,098,900,664 | |
| 772,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 657,251,392 | 130,945,531 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 35,615,000 | හැකියා වර්ධනය | 14 | 30,629,379 | 80,647,386 | |
| 1,775,700,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,401,951,070 | 619,289,734 | |
| 27,872,105,100 | **මුළු මූලධන වියදම් (උ)** | | 24,233,632,411 | **22,049,146,415** | |
| | තැන්පතු ගෙවීම් | | 20,199,296 | 201,924,580 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 24,186,622 | 12,736,953 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ර.ආ. ආපසු ගෙවීම් | | - | 32,795 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **44,385,919** | **214,694,328** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **28,962,126,466** | **26,413,439,724** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (20,458,108,002) | **(16,793,487,577)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (20,566,702,091) | (16,794,154,518) | ඒසීඒ-7 |
| - | **2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 108,594,090 | 666,941 | ඒසීඒ-3 |
| | | | (20,458,108,002) | **(16,793,487,577)** | |

*වගුව 3.1*

ඒසීඒ-පී

# 2025දෙසැම්බර් 31 දිනට

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තතය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,315,791,493 | 1,284,552,605 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 366,335,479 | 203,614,093 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 108,594,090 | 666,941 |
| **මුළු වත්කම්** | | **1,790,721,062** | **1,488,833,639** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 38,220,921 | (127,986,815) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,315,791,493 | 1,284,552,605 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 326,428,806 | 324,788,756 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,685,752 | 6,812,152 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 108,594,090 | 666,941 |
| **මුළු වගකීම්** | | **1,790,721,062** | **1,488,833,639** |

*වගුව 3.2*

ඒසීඒ-8

## 2025 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,315,791,493 | 1,284,552,605 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 366,335,479 | 203,614,093 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 108,594,090 | 666,941 |
| **මුළු වත්කම්** | | **1,790,721,062** | **1,488,833,639** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 38,220,921 | (127,986,815) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,315,791,493 | 1,284,552,605 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 326,428,806 | 324,788,756 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,685,752 | 6,812,152 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 108,594,090 | 666,941 |
| **මුළු වගකීම්** | | **1,790,721,062** | **1,488,833,639** |

පිටු අංක 01 සිට 57 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 58 සිට 69 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස්වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..................... | ................. | ..................................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නාම : | නාම : | නාම : |
| තනතුර : | තනතුර : | |
| දිනය :2026.02. 26 | දිනය :2026.02. | දිනය :2026.02. 25 |

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ටී.සී. මහානාම
ප්‍රධාන මූල්‍ය නිලධාරී
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07.

Page 02

*වගුව 3.3*

ජ්සීජ්-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතා | |
|---|---|---|
| | 2025 රු. | 2024 රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 43,889,879 | 29,882,517 |
| අග්‍රිම ලැබීම් | 8,421,120,991 | 5,315,689,228 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 10,702,479 | 7,892,018 |
| තැන්පතු ලැබීම් | 14,953,192 | 55,998,186 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **8,490,666,541** | **5,409,461,949** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 278,528,688 | 219,487,663 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,948,634,494 | 922,910,083 |

| | | |
|---|---|---|
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම | 37,956,856 | 25,439,157 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 108,594,090 | 405,567 |
| අත්තිකාරම් ගෙවීම් | 22,549,965 | 9,524,999 |
| තැන්පතු ගෙවීම් | 20,199,296 | 77,463,807 |
| ආදාමෙන් ආපසු ගෙවීම් | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,416,463,390** | **1,255,231,276** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **6,074,203,152** | **4,154,230,673** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 6,074,203,152 | 4,154,230,673 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **6,074,203,152** | **4,154,230,673** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(6,074,203,152)** | **(4,154,230,673)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **-** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |

*වගුව 3.4*

## 3.4. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000'

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 3,950,000 | 5,620,745 | 4,684,108 | 83% |
| ප්‍රාග්ධන | 27,700,000 | 27,872,105 | 24,233,632 | 87% |
| එකතුව | 31,650,000 | 33,492,850 | 28,917,741 | 86% |

*වගුව 3.5*

## 3.5. 2025.12.31 දිනට මූලධන වියදම් සාරාංශය

| අයිතමය/විස්තරය | 2025ශුද්ධ ප්‍රතිපාදනය | ප්‍රතිපාදන | | ප්‍රතිපාදන උපවයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | | වියදම | ඉතිරිය | |
| පරිපාලන හා ආයතනික සේවා | 1,886 | 1,471 | 414 | 78% |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 9 | 6 | 3 | |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 14 | 14 | 0 | |
| සේවක පුහුණු වැඩසටහන් | 1 | 0.7 | 0.3 | 68% |
| රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 434 | 405 | 29 | 93% |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 190 | 0 | 190 | 0% |
| කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 900 | 766 | 134 | 85% |
| රුහුණු විශ්වවිද්‍යාලයේ සාගර හා නාවික කටයුතු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 113 | 83 | 30 | 73% |
| රුහුණ විශ්වවිදයාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සංවර්ධනය කිරීම | 225 | 196 | 29 | 87% |
| | | | | |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 25,214 | 22,105 | 3,109 | 88% |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 1480 | 834 | 646 | 72% |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 1,897 | 1,535 | 362 | 81% |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 13,419 | 13,474 | 16.04 | 100% |
| මඩකලපුව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකිරීම | 300 | 0.00 | 300 | 0% |
| සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 6,323 | 4,938 | 1,385 | 78% |
| මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 37 | 0 | 37 | 0% |
| උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේධාරිතා වර්ධන කාර්ය මණ්ඩල පුහුණුව(එරාස්මස්) | 16 | 13 | 3 | 83% |

| | | | | |
|---|---|---|---|---|
| විදේශ ව්‍යාපෘති ප්‍රදාන | 75 | 47 | 28 | 63% |
| වියලි කලාපීය කෘෂිකර්මයේ පර්යේෂණ සහ අධ්‍යාපන ධාරිතා වැඩිදියුණු කිරීම යාපනය විශ්වවිද්‍යාලය | 100 | 0 | 100 | 0% |
| කොළඹ විශ්වවිදයාලයේ වෛද්‍ය පීඨයේ මහල් 17ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 1084 | 1083 | 0 | 100% |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 212 | 179 | 33 | 85% |
| ඉහල ශ්‍රේණිගත විදේශ විශ්වවිද්‍යාලයක උපාධි අපේක්ෂක ශිෂයත්ව වැඩසටහන | 200 | 2 | 198 | 1% |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය | 772.5 | 657 | 115 | 85% |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 200 | 200 | 0 | 100% |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 343 | 319 | 24 | 93% |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 230 | 139 | 91 | 60% |
| **එකතුව (මූලධන වියදම්)** | 27,872 | 24,234 | 3,638 | 87% |

*වගුව 3.6*

❖ **පාසල් අංශය හා උසස් අධ්‍යාපන අංශය යන දෙඅංශයේ ම තනි විගණන වාර්තාවක් නිකුත් කර ඇති බැවින් එය පාසල් අංශයේ 2025 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 3 පරිච්ඡේදයේ 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව යටතේ දක්වා ඇත.**

# 04. පරිච්ඡේදය - කාර්ය සාදන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ෂක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **50%-74%** | **75%-89%** | **100%-90%** |
| උපාධිධාරී රැකියා නියුක්ත භාවය. | **70.2%** | | |
| ජාතික උසස් අධ්‍යාපන පද්ධතිය වෙත සිසුන් ඇතුලත් කර ගැනීමේ වැඩිවීම. | | | **101.1%** |
| විශ්ව විද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම. | 71.1% | | |

*4.1 වගුව*

***2024/2025** අධ්‍යයන වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **(UGC)** යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව **43,237** නමුත් **2024/2025** අධ්‍යයන වසර සඳහා මේ වන විටත් සිසුන් බඳවා ගැනීම අවසන්ව නැත. එහෙත් 2026 පෙබරවාරි 28 වන විට 44,881ක් බඳවා ගෙන ඇත.

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/ අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%- 74% | 75%-100% |
| 4.3 2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම. | • පොළී රහිත ශිෂ්‍යාණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.<br>• ජාතික උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.<br>• විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.<br>• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.<br>• ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම. | ඇතුලත් කර ගන්නා සිසුන් ගණනේ වැඩිවීම. | 42% | 57% | 101.1% (*)<br>106.2%<br>82% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4.5 2030 වන විට<br>I. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම.<br><br>II. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම<br><br>III. අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනිමට අවස්ථාව සැලසීම. | • ඉලක්ක සපුරා ඇත.<br><br>• ඉලක්ක සපුරා ඇත.<br><br>• මෙම අමාත්‍යංශයේ විෂය පථයට අයත් නොවේ. | | | | 100%<br><br>100%<br><br>- |
| 4.7 2030 වන වට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධන ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවයන් ලබා ගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම් , සාමය සහ ප්‍රචන්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිදත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | - | - | - | - | - |

*5.1 වගුව*

**(*) 2024/2025** අධ්‍යයන වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **(UGC)** යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් **43,237** ඇතුලත් කර ගැනීමට අපේක්ෂා කරන ලදී. නමුත් **2024/2025** අධ්‍යයන වසර සඳහා මේ වන විටත් සිසුන් බඳවා ගැනීම අවසන්ව නැත.සාමාන්‍ය ප්‍රවේශය යටතේ මේ වන විට ඇතුලත් කරගෙන ඇති සංඛ්‍යාව **43,729** කි.එසේ වුවද **2023/2024** අධ්‍යයන වර්ෂයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

සභාව (UGC) යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් **43,204** බඳවා ගැනීමට අපේක්ෂා කල අතර සිසුන් **44,881** බඳවා ගන්නා ලදී. එය ප්‍රතිශතයක් ලෙස **104%** වේ.

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග සැකෙවින් විස්තර කරන්න.

**තිරසර සංවර්ධන අරමුණු (SDG) 4.5 සපුරා ගැනීම සම්බන්ධව.**

| | |
|---|---|
| 1. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම. - | උසස් අධ්‍යාපන අවස්ථා සඳහා තෝරා ගැනීම හුදෙක් Z- අගය මත රඳා පවතී. එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් නොවේ. |
| 2. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම. - | උසස් අධ්‍යාපනයේ එක් එක් මට්ටම් අර්ථ දක්වා ඒ සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය සුදුසුකම් ද දක්වා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) මත සකස් කර ඇත. ඒ අනුව සුදුසුකම් සපුරා ලන ඕනෑම අයෙකුට විවිධ මට්ටම් වලට ප්‍රවේශ වීමට ඇති අවස්ථාවන් තහවුරු කර තිබේ. අමාත්‍යාංශය යටතෙහි වූ සියළුම අධ්‍යාපන ආයතනයන් මෙම රාමුවට අනුගත කර ඇත. |
| අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනිමට අවස්ථාව සැලසීම. - | මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ. |

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛාව | ඇබෑර්තු/පුරප්පාඩු ** |
|---|---|---|---|
| ජ්‍යෝෂ්ඨ | 26 | 22 | 04 |
| තෘතීයික | 5 | 2 | 3 |
| ද්විතියික | 155 | 125 | 30 |
| ප්‍රාථමික | 44 | 36 | 08 |

*6.1 වගුව*

6.2 ** මෙලෙස තනතුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් එක් නිලධාරියෙකුට විෂයයන් කිහිපයක කාර්යයන් ඉටු කිරීමට සිදුවීම නිසා අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම දුෂ්කර වී ඇත. එබැවින්, අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණුව ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Promoting South Asia Regional Cooperation in Higher Education Conference | 1 | දින 04 | | $125 | විදේශීය | |
| NEO-ICP-ENFP Meeting, Brussels | 1 | දින 03 | | පවුම් 75 $ 125 | විදේශීය | |
| පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වා ගෙන යාම පිළිබඳව පුහුණු වැඩසටහන | 3 | දින 01 | රු.19,500.00 | | දේශීය | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වා ගෙන යාම පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Capacity Building Programme on Digital Governance for the Civil Servants of Sri Lanka | 1 | දින 12 | | පවුම් 75$ 325 | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම,පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය,විනය සහ පටිපාටික රීති පිළිබඳව පුහුණු වැඩසටහන | 70 | දින 01 | රු.39,680.00 | | දේශීය | කාර්යාල ක්‍රම,පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය,විනය සහ පටිපාටික රීති පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳව පුහුණුව | 66 | දින 01 | රු.16,392.84 | | දේශීය | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 3 | දින 01 | රු.18,000.00 | | දේශීය | විනයගරුක රියදුරෙකුගේ වගකීම, ආරක්ෂිතව රිය පැදවීම සහ මාර්ග නීති පිළිබඳවත් වාහන නඩත්තු සිදු කළ යුතු ආකාරය පිළිබඳවත් දැනුමින් නිපුණ වීම |
| Capacity Building Programme on Strategic Leadership and Governance 2nd Programme for the Civil Servants of Sri Lanka | 1 | දින 11 | | $325 | විදේශීය | |
| අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන් ජාලයේ පළමු අදියර | 18 | දින 1 | රු.3,622.00 | | දේශීය | අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම |
| අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන් ජාලයේ දෙවන අදියර | 23 | දින 1 | රු.4,252.00 | | දේශීය | අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම |
| අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන් ජාලයේ තෙවන අදියර | 22 | දින 1 | | | දේශීය | අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම |
| අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන් ජාලයේ සිවුවන අදියර | 24 | දින 1 | රු. 2,770.00 | | දේශීය | අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන් ජාලයේ පස්වන අදියර | 21 | දින 1 | රු. 4,280.00 | | දේශීය | අන්තර්ජාලය සහ AI තාක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම |
| රජයේ වාහන නඩත්තුව | 1 | දින 1 | රු.6,500.00 | | දේශීය | රජයේ වාහන නඩත්තුව පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම නව වැටුප් චක්‍රලේඛනයට අනුව | 1 | දින 1 | රු.6,500.00 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 1 | දින 2 | රු.12,000.00 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Regional Forum on successful project design and implementation (SPDI) | 1 | දින 3 | | $ 125 | විදේශීය | |
| ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2 | දින 2 | රු.24,000.00 | | දේශීය | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| New Trends in Labour Law | 1 | දින 1 | රු. 6,500.00 | | දේශීය | කම්කරු නීතිය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| ලිපිගොනුකරණය හා රාජකාරි ලිපි ලිවීම | 52 | දින 1 | රු.113,140.00 | | දේශීය | ලිපිගොනුකරණය හා රාජකාරි ලිපි ලිවීම පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Going Global Conference -2025 | 2 | දින 5 | | පවුම් 75 $ 300 | විදේශීය | |
| හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය | 1 | දින 1 | රු. 6,500.00 | | දේශීය | හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳව දැනුමින් නිපුණ වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Procurement New Guidelines 2024 | 1 | දින 1 | රු. 7,500.00 | | දේශීය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම | 1 | දින 1 | රු.6,500.00 | | දේශීය | කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Project Management | 3 | දින 2 | රු.36,000.00 | | දේශීය | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| මූලික විමර්ශනය | 5 | දින 1 | රු.32,500.00 | | දේශීය | මූලික විමර්ශනය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Invitation to the Sixth Session of the Tokyo Convention Committee in conjunction with the Fifth Plenary of the Asia-Pacific Network of National Information Centres & the Nineteenth Session of the 1983 Bangkok Convention Committee | 1 | දින 3 | | $ 160 | විදේශීය | |
| Audit Quaries | 1 | දින 1 | රු.7,500.00 | | දේශීය | විගණන විමසුම් පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| සහයක කාර්යමණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 1 | දින 2 | රු.12,000.00 | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| 11th ADB International Education and Skills forum applying a fresh lens to unlock the | 1 | දින 4 | | $ 150 | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| power of human capital | | | | | | |
| Finance Regulation | 3 | දින 1 | රු.22,500.00 | | දේශීය | මූල්‍ය රෙගුලාසි පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Higher National Diploma in Public Procurement and Contract Administration - Degree Level | 1 | අවුරුදු 01 | රු.69,000.00 | | දේශීය | |
| Safe Science for Economical driving training | 4 | දින 1 | රු.24,000.00 | | දේශීය | විනයගරුක රියදුරෙකුගේ වගකීම, ආරක්ෂිතව රිය පැදවීම සහ මාර්ග නීති පිළිබඳවත් වාහන නඩත්තු සිදු කළ යුතු ආකාරය පිළිබඳවත් දැනුමින් නිපුණ වීම |
| The 25th ICT er International Conference (ICTer2025) | 1 | දින 1 | රු.7,500.00 | | දේශීය | |
| Developing Attitude and Professional knowledge of Drivers & KKS | 6 | දින 1 | රු.45,000.00 | | දේශීය | කාර්යාල කාර්ය සහයක නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය වීම |
| Training on Official Letters & report writing skills | 1 | දින 1 | රු.7,500.00 | | දේශීය | රාජකාරී ලිපි සහ වාර්තාලිවීමේ හැකියාව වර්ධනය වීම |
| Workshop on database Application using MS Access | 4 | දින 2 | රු.60,000.00 | | දේශීය | MS Access පිළිබඳව දැනුමින් නිපුණ වීම |
| Using Ms Excel in your workplace | 5 | දින 2 | රු.70,000.00 | | දේශීය | MS Excel පිළිබඳව දැනුමින් නිපුණ වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙදින පුහුණු වැඩසටහන | 4 | දින 2 | | | දේශීය | |

*වගුව 6.2*

* රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා වර්ධනය සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමෙන් නව විෂය කරුණු සම්බන්ධයෙන් දැනුම වර්ධනය වන අතර කාර්යක්ෂම සේවාවක් එමගින් ඉටු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | – | – |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | | – | – |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | – | – |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | – | – | – |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | – | – | – |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | – | – | – |
| 1.6 | වෙනත් | – | – | – |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** (මු.රෙ.445) | | – | – |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | – | – |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | – | – |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | – | – |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග** |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම** (මු.රෙ. 135) | | – | – |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | | – | – |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | | – | – |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | | – | – |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | | – | – |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | | – | – |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | | – | – |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | – | – |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | | – | – |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | | – | – |
| 5 | **විගණන විමසුම්** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | - | - | - |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | _ | _ |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | _ | _ |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | _ | _ |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | _ |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | _ | _ |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ කමිටු 03 ක් පවත්වා ඇත. | | _ |
| 8 | **වත්කම් කළමනාකරණය** | | _ | _ |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | _ | _ |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | | _ | _ |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | _ | _ |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | | – | – |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | | – | – |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග** |
| 9 | **වාහන කළමනාකරණය** | | – | – |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | | – | – |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | | – | – |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | – | – |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | | – | – |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | | – | – |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | | – | – |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | – | – |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | | – | – |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | | _ | _ |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | _ | _ |
| | | | | |
| | | | | |
| | | | | |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | **අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)** | **අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම** | **අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග** |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | _ | _ |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | | _ | _ |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | | | _ |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | _ | _ |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | | _ | _ |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | | _ | _ |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | _ | _ |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | | – | – |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | – | – |
| 14 | **අග්‍රිම ගිණුම** | | – | – |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | | – | – |
| **අංකය** | **අදාළ කර ගත යුතු අවශ්‍යතාව** | | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | | – | – |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | | – | – |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | | – | – |
| 15 | **ආදායම් ගිණුම** | | – | – |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | – | – | – |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | – | – | – |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | – | – | – |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | – | – |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | | – | – |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | | – | – |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | – | – |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | – | – |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු | | – | – |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | | – | – |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | | – | – |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | – | – |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | | – | – |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | – | – |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | – | – |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | | – | – |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | – | – |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | – | – |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | | – | – |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | – | – |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | | – | – |

*වගුව 7.1*